වාර්ෂික වාර්තාව - 2022

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
අධ්‍යාපන අමාත්‍යාංශය
5 වන මහල, "මෙහෙවර පියස" ගොඩනැගිල්ල, කොළඹ 05

පටුන

පිටුව

කොමිසමෙහි සාමාජිකයින් 4

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 5

කොමසාරිස්තුමාගේ පණිවිඩය 6-7

අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය 8-9

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 10-11

1.1 හැඳින්වීම 10

1.2 දැක්ම 10

1.3 මෙහෙවර 10

1.4 පරමාර්ථ 10

1.5 කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන් 10-11

1.6 ආයතනික සැලැස්ම 12

1.7 මානව සම්පත් 13

1.8 කොමිසමේ පාලක මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් 14

2. 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන් 15-35

2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන, “සහසක් නිමැවුම් 2022” අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය 15-16

2.1.1 “සහසක් නිමැවුම් 2022” හි ආරම්භක ප්‍රගතිය 16

2.1.2 සහසක් නිමැවුම් අන්තර්ජාතික තරඟාවලියේ විනිශ්චය මණ්ඩල සමාජිකයින් 17

2.2 පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසාර පරිසර හිතකාමී විදුලි උත්පාදන ක්‍රමවේදයන් හඳුනාගැනීම 18

2.3 පුනර්ජනනීය - තිරසාර බලශක්ති ආශ්‍රිත නව නිපැයුම් සහ නවෝත්පාදන සඳහා ප්‍රදර්ශනය සහ ආයෝජක හමුව 18-19

2.4 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය 19-20

2.5 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන “නව නිපැයුම් දිරිය” 20

2.5.1 නව නිපැයුම්කරු වෛද්‍ය තුලිත සිහලිඳු රන්වල (රයිසොසාර නව නිපැයුම) 20-21

2.5.2 නව නිපැයුම්කරු වෛද්‍ය එන්. ආර්. බී. නිශ්ශංක (ස්වභාවික ශාකසාර මදුරු දියරය සහ බාම් 21

2.6 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers) 21-22

2.7 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ BCS the Charted Institute for IT Sri Lanka Section සහයෝගිතාවය 22-23

2.8 කෘෂිකර්මයට අදාල නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 23

2.9 රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය 24

2.10 නව නිපැයුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු 24

2.11 ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් සඳහා වූ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ පාඨමාලාව 24-25

2.12 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම 25
2.13 යොවුන් නව නිපැයුම් දිරිගන්වන "Sri Lanka Inventors Commission youtube
චැනලය සහ facebook පිටුව 25-26
2.14 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය 27
2.15 ජාත්‍යන්තර රටවල පේටන්ට් අයදුම්කිරීම සඳහා සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය 27
2.16 කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් 27-29
2.16.1 නවෝත්පාදන විසඳුම් තුළින් මිනිසුන් හා වන ජීවීන් අතර ඇතිවන ගැටීම් අවම කිරීම සඳහා ව්‍යාපෘති27-28
2.16.2 තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායකත්ව නායකත්ව සංවර්ධන වැඩසටහන
(Young Inventors - Enterpreneur Lead Development - YEILD) 28-29
2.17 නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම 29
2.18 නව නිපැයුම්කරුවන්ගේ හමුව 30
2.19 විද්‍යා දිනය සැමරීම 30
2.20 අන්තර්ජාතික පිළිගැනීම 30-31
2.21 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය 31
2.21.1 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ස්ථාපිත කිරීමේ අරමුණ 31
2.22 SLIC-Huawei ICT Competition - තොරතුරු තාක්ෂණය හා සබැඳි නවෝත්පාදන තරඟාවලිය 32
2.23 නව නිපැයුම් ප්‍රවලිත කිරීමේ වෙනත් වැඩසටහන් 32-33
2.23.1 "Sri Lanka Inventors" - youtube ප්‍රවේශය 32
2. 23.2 නිල වෙබ් අඩවිය 33
2.24 මාධ්‍ය දායකත්වය 33
2.25 SLIC-SPAR Sri Lanka ව්‍යාපෘතිය 33-34
2.26 මානව සම්පත් සංවර්ධනය 35
3. මූල්‍ය ප්‍රකාශනය

කොමිසමෙහි සාමාජිකයින්

මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු මහතා
කොමසාරිස්
(2022.01.01 සිට 2022.12.31)

වෛද්‍ය ආර්. එම්. එච්. එම්. අනුප ඉන්දික හේරත් මහතා
සහකාර කොමසාරිස්
(2022.01.01 සිට 2022.12.31)

මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය
සහකාර කොමසාරිස්
(2022.01.01 සිට 2022.06.21)

කල්පනී රාජපක්ෂ මිය
සහකාර කොමසාරිස්
(2022.11.01 සිට 2022.12.31)

පී. වී. බී. පී. සිසිර නන්දන මහතා
භාණ්ඩාගාර නියෝජිත
(2022.01.01 සිට 2022.02.18)

එම්. කේ. ඩී. එන්. මාදම්පේ මිය
භාණ්ඩාගාර නියෝජිත
(2022.02.26 සිට 2022.12.31)

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

පී. වී. බී. පී. සිසිර නන්දන මහතා
භාණ්ඩාගාර නියෝජිත
(2022.01.01 සිට 2022.02.18) දක්වා

එම්. කේ. ඩී. එන්. මාදම්පේ මිය
භාණ්ඩාගාර නියෝජිත
(2022.02.26 සිට 2022.12.31)

මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය
සහකාර කොමසාරිස්
(2022.01.01 සිට 2022.06.21)

වෛද්‍ය ආර්. එම්. එච්. එම්. අනුප ඉන්දික හේරත් මහතා
සහකාර කොමසාරිස්
(2022.01.01 සිට 2022.12.31)

එච්. ඩී. අනුරුද්ධිකා මහත්මිය
අභ්‍යන්තර විගණක
(2022.01.01 සිට 2022.12.31)

එච්. එම්. යූ. එස්. ඒ. විජේකෝන් මහතා
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත
(2022.01.01 සිට 2022.12.31)

ඩබ්. පී. එල්. එස්. ආර්. පෙරේරා මහත්මිය
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත
(2022.01.01 සිට 2022.12.31)

කොමසාරිස්තුමාගේ පණිවිඩය



මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්

ලෝකය ජය ගත හැකි නව නිර්මාණශීලී හෙට දවස ගැන පෙරවදනක් සැපයීම, ශ්‍රී ලාංකිකයන් ලෙස නව ආර්ථික රටාවකට යන ගමනට ආශීර්වාදයක් වේ යැයි සිතමි.

ශ්‍රී ලංකාවේ නව නිර්මාණශීලී මිනිසුන්ට හෙට ලෝකය ජයගත හැකි නව ප්‍රවේශයක් සැපයීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සිදුකරනු ලබන කාර්යභාරය මනා පිටුවහලක් වී හමාරය. සීඝ්‍රයෙන් දියුණු වන ලෝකයේ දියුණුවේ අඩිතාලම වනුයේ නව සොයාගැනීම් බව කවරෙකුට වුව ද පැහැදිලි කරුණක් වන අතර එලෙස දියුණුව කරා පිය නගන ලෝකයේ ශ්‍රී ලාංකීය නව නිපැයුම් වලට පණ පොවන ආයතනය වනුයේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමයි. ශ්‍රී ලංකාවේ ජන සමාජයට බලපෑම් කරනු ලබන විදේශ විනිමය උත්පාදනයට හා දේශීය ආර්ථිකයේ වර්ධනයට නව නිපැයුම් සහ ඒ ආශ්‍රිත නවෝත්පාදන වෙතින් කෙරෙන බලපෑම අතිමහත් ය.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වාර්ෂිකව බල ගන්වන "සහසක් නිමැවුම්" ජාතික හා අන්තර්ජාතික ප්‍රදර්ශනයේ සිට නව නිපැයුම් සමාජ පිහිටුවීම, නව නිපැයුම් වාණිජකරණය, සුදුසුකම් සපුරාලනු ලබන නව නිපැයුම්කරුවන්ට ණය සහනාධාර ලබාදීම හා ඔවුන්ගේ නවෝත්පාදන සඳහා දේශීය, විදේශීය වෙළෙඳපළ අවස්ථා උදාකර දීම වැනි කාර්යයන් ඔස්සේ නව තාක්ෂණික ඥානය හා නව ආර්ථික ක්‍රම සම්පාදනය වනවා මෙන්ම ඒ තුලින් නව නිර්මාණකරුවන් ලබාගන්නා අවස්ථා ද අපමණ ය. අප රටේ නව නිපැයුම්කරුවන් ව්‍යවසායකයන් වී, ආර්ථික අතින් ස්වයංපෝෂිත වී, ඔවුන්ගේ නව නිපැයුම් සඳහා ඉහළ ප්‍රතිලාභ ලබන විට එහි බලපෑම දේශීය ආර්ථිකයට වඩාත් යහපත්ව දැනෙනු ඇත.

නව නිර්මාණයේ අඩුපාඩු, ශක්‍යතා අවබෝධ කරගෙන ඒවාට පිළියම් සපයමින්, නව තාක්ෂණික ක්‍රම සොයමින්, නිර්මාණය සංවර්ධනය කර ගැනීමට පේටන්ට් බලපත්‍ර අයිතිය ලබා ගනිමින් නිර්මාණයේ ආරක්ෂාව සහතික කර ගැනීමට අවශ්‍ය මහ පෙන්වීම ලබාදීමට ද අප නිබඳවම ක්‍රියාකරන්නෙමු.

2022 වර්ෂයේදී ද කොමිසම වෙත පැවරී තිබූ අභියෝග අතිමහත් වූ අතර කාර්යමණ්ඩලයේ කැපවීම හා රේඛීය අමාත්‍යාංශයේ මහ පෙන්වීම මත සමස්ත ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි පාසල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන, විවෘත හා වාණිජකරණ යනුවෙන් හඳුනාගත් අංශ 4ක් සඳහා තාක්ෂණික ක්ෂේත්‍ර 14ක් ඉලක්ක කර ගනිමින් නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් රාශියක් සාර්ථකව මෙහෙයවා ඇත.

නිර්මාණාත්මක නිපැයුම් තුළින් රට සවිබල ගන්වා නව නිපැයුම් වෙළඳපළක් නිර්මාණය කිරීම වෙනුවෙන් නව අදහස්, නිමැවුම් රට හමුවේ තැබීමේ කාලය උදාවී තිබේ.

ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වශයෙන් දේශීය නව නිපැයුම්කරණය හා ප්‍රවර්ධිකරණය ඉහළ නැංවීම තුළින් සමාජ, ආර්ථික සංවර්ධනය හරහා ශ්‍රී ලාංකේය නාමය ගොඩනැංවීම වෙනුවෙන් ගෙන ඇති පියවරයන් රාශියකි.

ශ්‍රී ලාංකිකයන් ගේ නව නිපැයුම් කුසලතා වැඩිදියුණු කිරීමේ, පෝෂණය කිරීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ශ්‍රී ලාංකීය අනන්‍යතාවයෙන් යුතු නව නිපැයුම් වලින් පරිපූර්ණ නව නිපැයුම් සංස්කෘතියක් බිහි කිරීමේ අරමුණ කරා ක්‍රම ක්‍රමයෙන් ගමන් කිරීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අපේක්ෂාව යි. එම අපේක්ෂාව යථාර්තයක් කරා මෙහෙයවන ගමනේ දී අපට ආශීර්වාදයක් වූ පිරිස වෙත කෘතවේදීත්වය පිරිනැමීම කිසිසේත් අමතකල කළ යුතු නොවේ.

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ අනාගතය උදෙසා සුවිශේෂී සේවාවක් ඉටුකරන්නා වූ සියලු දෙනා වෙත කොමිසමේ කෘතවේදීත්වය පිරිනමන අතර එකී ජාතික මෙහෙවර ඉටුකිරීම වෙනුවෙන් නිරතුරුව ශක්තියක් වන කොමිසමේ කාර්ය මණ්ඩලයට හා ඊට නිසි මඟ පෙන්වීමක් ලබාදුන් කොමිසමේ පාලක මණ්ඩල සාමාජිකයන්ට ද නිරතුරුවම අප වෙත මඟ පෙන්වීම ලබාදෙන, ලබාදුන් ගරු විෂයභාර අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමන් සහ පෙර සිටි අමාත්‍යතුමිය විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මැතිණිය වෙත ද රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන්ට මෙන්ම සෙසු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙත ද මාගේ කෘතවේදීත්වය පල කර සිටින අතරම නව නිපැයුම් බිහි කරමින් රට තුළ නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීමට දායකත්වය දැක්වූ සියළුම නව නිපැයුම්කරුවන්හට මාගේ සුභාශිංශන පිරිනමමි !

අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය



එන්. එන්. ඩබ්. දොලවත්ත මයා
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ බලාත්මක කිරීමේ මූලික පරමාර්ථය වන්නේ දේශීය නවෝත්පාදනයන් දිරිගැන්වීම සඳහා ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා නීතිමය සහයෝගය ලබාදීමයි. උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිසම මඟින් අභියෝගාත්මක 2022 වර්ෂයේදී ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කර ඇති අතර සිදුකරන ලද ප්‍රධාන කාර්යයන් සංක්ෂිප්තව දැක්වීමට කැමැත්තෙමි.

- සහසක් නිමැවුම් අන්තර්ජාතික සහ දේශීය නව නිපැයුම් හා නවෝත්පාදන තරඟාවලිය පැවැත්වීම සහ ඒ හරහා දේශීය ආර්ථිකයට ශක්තියක් වෙමින් විදේශ ආදායම් උත්පාදනය කිරීම.

- දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් සහ නවෝත්පාදන වාණිජකරණය කරා ගෙන යෑමට අවශ්‍ය තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ අවශ්‍ය තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාදීම.

- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් වඩාත් පුළුල් හා කාර්යක්ෂම සේවයක් නව නිපැයුම්කරුවන්ට ලබාදීමට කටයුතු කිරීම.

- පැවති අභියෝගාත්මක වාතාවරණය තුල දේශීය ආර්ථිකයට දායකත්වයක් ලබාදෙමින් ආනයන ආදේශක ලෙස උපයෝගී කරගත හැකි නව නිපැයුම් 14ක් ස්පාර් ශ්‍රී ලංකා සුපිරි වෙළෙඳසැල් ජාලය මඟින් වෙළෙඳපොල වෙත හඳුන්වාදීමට කටයුතු කිරීම.

- පාසැල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන වල නව නිපැයුම් සමාජ ඇති කරමින් තරුණ ප්‍රජාව නව නිපැයුම් සහ නවෝත්පාදන කෙරෙහි නැඹුරුතාවයක් ඇති කිරීමට කටයුතු කිරීම හා ඔවුන් ගේ නිර්මාණශීලීත්වය ඔප් නැංවීම.

- නවෝත්පාදන ව්‍යවසායකයින් දිරිගැන්වීම වෙනුවෙන් නව නිපැයුම් වාණිජකරණය සඳහා වන නව ව්‍යාපෘතිය (IAFM-SL) මඟින් ණය පහසුකම් ලබාදීම සහ රාජ්‍ය වාණිජ බැංකු හා සම්බන්ධීකරණය වෙමින් නව නිපැයුම් වාණිජකරණය සඳහා මූලික ප්‍රාග්ධනය සැපයීමට සැලසුම් කිරීම.

දේශීය නව නිපැයුම්කරුවා රාජ්‍ය ප්‍රතිපාදන සහ මූල්‍යාධාර මත යැපීමේ මානසිකත්වයෙන් මුදවාගෙන ඔවුන්ගේ නිර්මාණ ශක්තිය දේශීය ආර්ථිකය ගොඩනැංවීම සඳහා දායක කරගනිමින් සමාජය තුල නව නිපැයුම් සහ නවෝත්පාදන බිහිවීම උත්ප්‍රේරණය කරවන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම කොමිසමේ ප්‍රමුඛතම අරමුණ කි.

වර්තමානයේ පවත්නා දේශීය ආර්ථිකයේ අභියෝගාත්මක වටපිටාව තුල නව නිපැයුම්/නවෝත්පාදන ක්ෂේත්‍රයේ උපයෝගීතාවය සහ දිරිගැන්වීමේ අවශ්‍යතාවය මනාව වටහාගනිමින්, රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය මත නිදහස් කළ භාණ්ඩාගාර ප්‍රතිපාදන ඵලදායී ලෙස භාවිතා කිරීමට අපට හැකියාව ලැබුණි.

ඒ සඳහා කොමිසමේ පාලක මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ සහ අනුමැතීන් ද බෙහෙවින් ඉවහල් වූ අතර, නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය සහ දිරිගැන්වීමේ සමස්ත කාර්යභාරය වෙනුවෙන් 2022 වර්ෂය පුරාවට කොමිසමේ කාර්යමණ්ඩලය ඉතාමත් කැපවීමෙන් කටයුතු කළ ආකාරය ප්‍රශංසනීය වේ.

අප සතුව ඇති පුළුල් අත්දැකීම් හා දැනුම් සම්භාරය මෙන්ම වර්තමාන දේශීය සහ අන්තර්ජාතික වටපිටාව ද සැලකිල්ලට ගනිමින්, වඩාත් උසස් ගුණාත්මක සේවයක් සහ උසස් ප්‍රතිඵල අරමුණු කරගත් වැඩසටහන් 2023 වර්ෂයේ ද ක්‍රියාත්මක කිරීම කොමිසමේ අරමුණ වේ.

පවතින අභියෝගාත්මක වටපිටාව බාධකයක් ලෙස නොසලකා, එය අනර්ඝ අවස්ථාවක් බවට ප්‍රතිනිර්මාණය කර ගනිමින්, දේශීය ආර්ථිකය නංවාලීමට කොමිසම ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදෙන කොමසාරිස්තුමා ඇතුළු සියලුම පාලක මණ්ඩල සාමාජිකයින් ද රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමන් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය ද සියලුම සහෝදර රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන ද ඇගයීම් කටයුතු වලද දායක වූ සියලුම විනිශ්චය මණ්ඩල සාමාජික සාමාජිකාවන් ද ලබාදුන් නොමද සහාය කෘතවේදීව සිහිපත් කරමි. එමෙන්ම අදාල කාලසීමාව තුල රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යධුර හොබවන ලද ගරු අමාත්‍යවරුන් වෙතින් ලද සහයෝගය ද ස්තුතිපූර්වකව සිහිපත් කරන අතර ඉදිරියදී ද මේ සෑම දෙනාගේ ම සහාය කොමිසම වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

අවසාන වශයෙන් 2022 වර්ෂය තුල කොමිසම සමඟ සක්‍රීයව සම්බන්ධවෙමින් දේශීය ආර්ථිකය බලගැන්වීමෙහිලා තම දායකත්වය ලබාදුන් සියලුම නව නිපැයුම්කරුවන් කෘතවේදීව සිහිපත් කරන අතර, ඉදිරියේදී ද ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා උපරිම සහයෝගය ලබාදීමට අප හා අත්වැල් බැඳගන්නා ලෙසට සමස්ත ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් හා නවෝත්පාදකයින් වෙත සහෝදරත්වයෙන් ඇරයුම් කරමි.

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ නිෂ්පාදනය දිරි ගැන්වීමත්, ඒවාට සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් වෙනුවෙන් 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. වර්තමානයේ කොමිසම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 දැක්ම

"නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්"
(නව නිපැයුම් හා නවෝත්පාදන තුලින් සෞභාග්‍යය උදා කිරීම)

1.3 මෙහෙවර

ශ්‍රී ලාංකිකයින්ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීම ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම.

1.4 පරමාර්ථ

1.4.1. ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නිර්මාණය කරනු ලබන නව නිපැයුම් සඳහා ධෛර්යය දීම.

1.4.2. නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික, මූල්‍ය හා නීති ආධාර ලබා දීම.

1.4.3. 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් සියලු බලතල, කර්තව්‍යය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

1.4.4 ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලු කටයුතු කිරීම.

1.5 කොමිසමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන්

(අ) කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේදී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම් පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

(ආ) පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

(ඇ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම්වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නඩු වල දී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

(ඈ) නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවන්ට දීර්ඝ කාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නීර්දේශයන් ඉදිරිපත් කිරීම. නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

(ඉ) දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම.

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂා, සුභ සාධනය හා ජාතික ආරක්ෂාව, පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්ය දීම.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවනට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(ඌ) "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන" තරඟවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන "නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්" වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.


(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළකිරීම සහ පතල කර හැරීම.

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟවලට සහභාගීවීමට ශ්‍රී ලාංකීක නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟවලට ඔවුන් නිර්දේශ කිරීම.

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විශ්වවිද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

1.6 ආයතනික සැලැස්ම



1.7 **මානව සම්පත**

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2022 වර්ෂයේ කාර්ය මණ්ඩලය	2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	02	02	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)	01	01	-
නීති නිලධාරී	01	-	01
වැඩසටහන් නිලධාරී	03	03	-
පරිපාලන නිලධාරී	01	01	-
මූල්‍ය නිලධාරී	01	01	-
පර්යේෂණ සහකාර	05	02	03
කළමනාකරණ සහකාර	07	05	02
රියදුරු	04	04	-
කාර්යාල සහායක	02	02	-

1.8 කොමිසමේ පාලක මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්



මහාචාර්ය එන්. එම්.එස්.සිරිමුතු මහතා
කොමසාරිස්



වෛද්‍ය අනුප හේරත් මහතා
සහකාර කොමසාරිස්



කල්පනී රාජපක්ෂ මිය
සහකාර කොමසාරිස්



එම්. කේ. ඩී. එන්. මාදම්පේ මිය
භාණ්ඩාගාර නියෝජිත



එන්. එන්. ඩබ්. දොලවත්ත මයා
අධ්‍යක්ෂ(ප්‍ර. වි. නි.)



ඩී. ඒ. සරත්චන්ද්‍ර
සහකාර අධ්‍යක්ෂ(මුදල්)



ඩී. එම්. එල්. රත්නායක මයා
සහකාර අධ්‍යක්ෂ(ව්‍යාපෘති)



පී. එල්. ලියනගම මිය
සහකාර අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති)

2. 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන, “සහසක් නිමැවුම් 2022” අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය

“සහසක් නිමැවුම්” අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය හා තරඟාවලිය නව නිපැයුම්කරුවන්ට සුවිශේෂී ප්‍රතිලාභ අත්කර දෙන්නා වූ වැඩසටහනකි. මෙය සංවිධානය කරන ලද්දේ නව නිපැයුම් නිවැරදිව සමාජගත කිරීම, ආයෝජක ප්‍රජාව හා සම්බන්ධ වෙමින් නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා රැගෙන යාම, දැනුම හා තාක්ෂණය සෙසු නිර්මාණකරුවන් සමඟ හුවමාරු කරගැනීම, ජයග්‍රහණ සඳහා නිසි ඇගයීමක් ලබාගැනීම මෙන්ම අන්තර්ජාතික මට්ටමේ ප්‍රදර්ශනයකට ඉදිරිපත් වීමේ අවස්ථාව හිමි කර ගැනීම යනා දී වූ විවිධ ප්‍රතිලාභ නව නිපැයුම්කරුවන් වෙත ලබාදීමේ අරමුණ ඇතිව ය.

මෙම තරඟයේදී දේශීය තරඟ අංශය නියෝජනය කරමින් පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් මෙන්ම විවෘත යන ප්‍රධාන අංශ හතරක් යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14) ට අදාල වන පරිදි තරඟය සඳහා ඉදිරිපත් වීමට ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසේ.

- මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහනය
- ඉංජිනේරු

වර්තමානයේ උද්ගතව ඇති ආර්ථික අවපාතය සහ COVID-19 වැනි පාරිසරික තත්ත්වයන් හමුවේ වුව ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සිය වැඩසටහන් බිඳවැටීමට ඉඩනොදී අඛන්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙසින් 2019 වසර දක්වා පළාත් මට්ටමේ දැනුවත් කිරීම් ඔස්සේ දීපව්‍යාප්ත මට්ටමින් සංවිධානය කළ සහසක් නිමැවුම් තරඟාවලිය ඉන් අනතුරුව මාර්ගගත වැඩසටහනක් (online competition) ලෙස ක්‍රියාත්මක කිරීම ඇරඹුනි. 2022 වසරේ දී ද එම ක්‍රමවේදය අනුගමනය කරමින් සාර්ථක තරඟාවලියක් පැවැත්වීමට අවස්ථාව සැලසුනි.

ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය පාදක කර කොමිසම විසින් “සහසක් නිමැවුම් 2021” සම්මාන ප්‍රධානෝත්සවය, 2022 ඔක්තෝම්බර් 26 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙම අවස්ථාවට අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් නදීකා වටලියද්ද, අධ්‍යක්ෂ ජනරාල් කුමාරි මීගහකොටුව, අධ්‍යක්ෂ ජනරාල් පී. එම්. ධර්මතිලක යන මහත්ම මහත්මීන් විශේෂ ආරාධිතයන් ලෙස සහභාගී වූ අතර සම්පත් දායකත්වය සැපයූ මහාචාර්යවරු, ආචාර්යවරු සහ ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් ඇතුළු 200 ක පමණ සම්භාවනීය පිරිසක් සහභාගී විය.


ඒ අනුව 2021 වසර වෙනුවෙන් ජාතික තරඟ අංශයේ ඇගයීම් අතුරින් රන් සම්මාන 30 ක් ද, රිදී සම්මාන 51 ක් ද, ලෝකඩ සම්මාන 39 ක් ද වශයෙන් හඳුනාගත් ජයග්‍රාහකයින් සඳහා සම්මාන සහ සහතිකපත් ප්‍රධානය කරන ලදී. මෙහිදී පාසල් අංශයේ කණිෂ්ඨ දසිස් කුසලානය "Smart Dustbin" නව නිපැයුමට හිමි වූ අතර, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන අංශයේ දසිස් කුසලානය "පෙව හරිත පොස්පේට් නිෂ්පාදන" යන නව නිපැයුමට හිමි විය. වාණිජකරණ අංශයේ දසිස් කුසලානය හිමි වූයේ "Utech Blackbox Telematic Device" නව නිපැයුමට ය. විනිශ්චයන්ට අනුකූලව 2021 වසර සඳහා විවෘත අංශය වෙනුවෙන් දසිස් කුසලානය හිමි කර ගැනීමට කිසිවෙක් සුදුසුකම් ලබා නොතිබුණි.



2.1.1 "සහසක් නිමැවුම් 2022" හි ආරම්භක ප්‍රගතිය

"සහසක් නිමැවුම් 2022" සඳහා දේශීය නව නිපැයුම් 403 ක්, විදෙස් නව නිපැයුම් 5ක් යනාදී වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. තරඟයේ සමස්ත අයදුම්පත් ඇගයීම සඳහා විශේෂඥ විනිසුරුමඩුල්ලක් සම්බන්ධව සිටින අතර, මේ වන විට ජාතික තරඟ අංශයේ ඇගයීම් අතුරින් රන් පදක්කම් 13ක්, රිදී පදක්කම් 14ක් සහ ලෝකඩ පදක්කම් 17ක් වශයෙන් ජයග්‍රහණ ප්‍රකාශයට පත් කර තිබේ. තවද "සහසක් නිමැවුම් 2022" හි "දසිස්" කුසලානය පිරිනැමීමේ ඇගයීම් කටයුතු මෙන්ම අන්තර්ජාතික තරඟයේ ඇඟයීම් කටයුතු ද අවසන් කිරීම සඳහා සැලසුම් සම්පාදනය කර ඇත. අන්තර්ජාතික තරඟ විනිශ්චය සඳහා මෙවරද කොමිසම සතුව පවතින අන්තර්ජාතික සම්බන්ධතා උපයෝගී කරගනිමින් විදේශීය නව නිපැයුම් ආයතන වලින් ඉතා සුදුසුකම් ලත් විදේශීය ඇගයීම් මඩුල්ලක් පහත පරිදි පත් කරගත හැකි විය.

2.1.2 සහසක් නිමැවුම් අන්තර්ජාතික තරඟාවලියේ විනිශ්චය මණ්ඩල සමාජිකයින්



"සහසක් නිමැවුම්" යනු නව නිපැයුම්කරුවන්ට සිය නිපැයුම් ප්‍රදර්ශනය කිරීමට ගොඩනංවා ඇති සුවිශේෂී වේදිකාවක් වන අතරම, අනාගත අභියෝගයන්ට මුහුණ දෙමින්, එදිනෙදා ජීවිතයේ සුවපහසුව ලඟා කරදීම සඳහා වන තාක්ෂණික මෙවලම් වැඩිදියුණු කිරීම ඔස්සේ විශිෂ්ට ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම සඳහා වන ප්‍රධාන ප්‍රවේශ මාර්ගයක් ද වේ.

2019 වසර දක්වා රාජ්‍ය භාණ්ඩාගාරය මත පමණක්ම යැපෙමින් සිය කාර්යභාරයට අවතීර්ණ වී සිටි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 2019 වසරේ සිට ආදායම් උපයන මාර්ගයට පිවිස සිටී. ඒ අනුව, "සහසක් නිමැවුම්" කේන්ද්‍ර කර ගනිමින් 2019 වසරේ සිට විදෙස් නව නිපැයුම් ලියාපදිංචිය මඟින් ආදායම් ඉපැයීමට කොමිසමට හැකියාව ලැබී ඇත. ඒ අනුව, නව නිපැයුම් වාණිජකරණය තුලින් දේශීය ආදායමට ශක්තියක් ගෙන දෙනවාට අමතරව ආදායම් උපයමින් රාජ්‍ය භාණ්ඩාගාරයට අත්වැලක් සැපයීමට ද කොමිසමට හැකියාව ලැබී තිබේ.

වර්ෂය	උපයන ලද මුදල	
2022	විදේශීයව ලද	500 USD
2022	දේශීයව ලද	137000 LKR

2.2 පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසාර පරිසර හිතකාමී විදුලි උත්පාදන ක්‍රමවේදයට අනුගත වූ නව නිපැයුම් හඳුනාගැනීම

පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසාර පරිසර හිතකාමී විදුලි උත්පාදන හා බලශක්ති අර්බුදයට නව නිපැයුම් තුලින් විසඳුම් සෙවීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් මූලාරම්භය ගෙන තිබේ. මේ සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියද, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, බලශක්ති අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල මෙන්ම දේශීය නවෝත්පාදකයන්ගේ දායකත්වය ද හිමි වී තිබේ. වර්තමානයේ රට තුල විදුලි අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් ලැබෙනුයේ පුනර්ජනනීය නොවන මූලාශ්‍රයන් වෙතිනි. මෙහිදී මූලික වශයෙන් නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් 44ක් විද්වත් මණ්ඩලයක් මඟින් ඇගයීමට ලක් කොට තෝරාගත් නව නිපැයුම් 11 ක මූලාකෘති නිර්මාණය හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය සහයෝගයන් ලබාදීමට අදාල ආයතන වෙත යොමු කර ඇත.

2.3 පුනර්ජනනීය - තිරසාර බලශක්ති ආශ්‍රිත නව නිපැයුම් සහ නවෝත්පාදන සඳහා පැවැත්වූ ප්‍රදර්ශනය සහ ආයෝජක හමුව

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, සුනිත්‍යය බලශක්ති අධිකාරිය සහ සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය ඒකාබද්ධව බලශක්ති සම්බන්ධ නව නිපැයුම් පිළිබඳ ප්‍රදර්ශනයක් 2022 සැප්තැම්බර් මස 11 සහ 12 යන දෙදින සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලන පරිශ්‍රයේදී පවත්වන ලදී. නව නිපැයුම් 75ක සංඛ්‍යාවක් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර, මෙහිදී නව නිපැයුම්කරුවන් හට ආයෝජකයින් හමුවීමට අවස්ථාව සැලසීම, පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීම සඳහා සහාය හිමි වීම, බලශක්තියට අදාළ විවිධ තාක්ෂණයන් සම්බන්ධව දැනුවත් වීමේ අවස්ථාව යනාදී විවිධ ප්‍රතිලාභ රැසක් නව නිපැයුම්කරුවන් හට හිමි විය.





2.4 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් පරිදි කොමිසම මඟින් හඳුනාගත් ශ්‍රී ලංකාවට වැඩදායී නව නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමට ණය දෙන ආයතන හා සම්බන්ධීකරණය කිරීම මෙම මූල්‍ය වර්ෂය තුලදී ආරම්භ කරන ලදි.

මෙම නව ප්‍රවේශය තුල ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් හට සිය පේටන්ට් බලපත්‍ර පමණක් ඇපය වශයෙන් තබමින් එම නව නිපැයුම් වාණිජකරණය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීමට කටයුතු සම්පාදනය කෙරේ.

මේ සඳහා මූලික ප්‍රවේශයක් ලෙස ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ආයතන වන ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලිඛිත ඉල්ලීමක් කොමිසම විසින් ඉදිරිපත් කරන ලදී. එම ඉල්ලීම් සඳහා ලංකා බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සුභවාදී ප්‍රතිචාරයන් දක්වන ලද අතර, එම බැංකු ද්විත්වය සමඟම සාකච්ඡාවන් කිහිපයක් පවත්වන ලදී. මෙහිදී වඩාත් නම්‍යශීලී ප්‍රතිචාරයක් දක්වන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ මූලික අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, කොමිසම මඟින් හඳුනාගත් වාණිජකරණ විභවයක් සහිත සහ මූල්‍ය අවශ්‍යතා ඇති නව නිපැයුම්කරුවන් හත් (07) දෙනෙකු හා සම්බන්ධ ක්ෂේත්‍ර නිරීක්ෂණ ද කොමිසම සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඒකාබද්ධව මේ වන විට සම්පූර්ණ කර ඇත.







2.5 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන ‘‘නව නිපැයුම් දිරිය’’

වාණිජකරණය සඳහා වෙළෙඳපොළ විභවයක් සහිත නව නිපැයුම් සඳහා පොළී රහිතව, නැවත පියවීමට එකඟත්වය ඇති කර ගත් කාල සීමාව තුලදී එම මුදල නව නිපැයුම්කරු විසින් ගෙවිය යුතු වන පරිදි ණය ලබාදීම සිදු කරයි. මෙම ණය ලබාදීම සඳහා විශේෂිත නිර්ණායකයන් අනුගමනය කරන අතරම, ඇගයීම් කමිටුවක් හරහා ලබාගන්නා නිර්දේශයන්ට අනුව කටයුතු කරනු ලබයි. මෙහිදී නව නිපැයුම නිමි භාණ්ඩයක් දක්වා වැඩිදියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහයෝගය හෝ පරීක්ෂණ වාර්තා රාජ්‍ය ආයතනයක් හරහා ලබා ගැනීමට සහයෝගය හා මූල්‍ය දායකත්වය ලබා දීම, පොළී රහිත ණය ලබාදීම, මූලාකෘති සකස් කිරීමට අවශ්‍ය සහයෝගය දැක්වීම යනාදී වශයෙන් විවිධ පැතිකඩ ඔස්සේ උපකාර කරනු ලබයි.

2.5.1 නව නිපැයුම්කරු වෛද්‍ය තුලිත සිහලිඳු රන්වල -‘‘රයිසෝසාර’’ නව නිපැයුම

මෙම ව්‍යාපෘතිය යටතේ වෛද්‍ය තුලිත සිහලිඳු රන්වල ගේ නව නිපැයුම වන ‘‘රයිසොසාර’’ වාණිජකරණය සඳහා රුපියල් මිලියන 5.8 ක ණය මුදලක් නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා වන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ලබා දෙන ලදී.

වෘත්තියෙන් වෛද්‍යවරයෙක් වන තුලිත සිහලිඳු රන්වල විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබමින් සිටි කාලවකවානුව තුල සිදුකරන ලද රසායනාගාර පර්යේෂණ හා පර්යේෂණ අත්හදා බැලීම් රාශියක අවසාන ප්‍රතිඵලයක් ලෙස ‘‘රයිසොසාර’’ නව නිපැයුම බිහි වී ඇත. ශාක වල කිරි, මූල වර්ධක ප්‍රතිකාරයක් ලෙස යොදාගනිමින් ‘‘රයිසොසාර’’ බිහි කිරීමට මෙම තරුණ නිර්මාණශීලි වෛද්‍ය වෘත්තිකයා සමත් වී ඇත.

කෘෂි තාක්ෂණ ක්ෂේත්‍රයේ දිශානතිය වෙනස් කළ හැකි ‘‘රයිසොසර’’ නව නිපැයුමෙහි කෘත්‍රිම රසායනික විෂකාරක අඩංගු නොවන අතර පරිසර පද්ධතියට හිතකාමී ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරකම් මඟින් ප්‍රශස්ථ මට්ටමේ ඵලදාවක් ලබා ගැනීමට ශ්‍රී ලාංකේය ගොවි මහතුන්ට ඉඩ ප්‍රස්ථාව ද සලසා දීම සුවිශේෂී වේ.

කොමිසම වෙතින් ලද තාක්ෂණික හා මූල්‍ය සහාය මෙන්ම නිරතුරුව ඔහු හා සම්බන්ධවෙමින් සාර්ථක ව්‍යවසායකයෙකු වීමට ලබාදුන් මාර්ගෝපදේශකත්වය ඔහුගේ ගමන්මඟෙහි ඇති බාධා ජයගැනීමට අත්වැලක් විය.

කෙටිකාලීන බෝග වගාව සඳහා උපයෝගී කරගත නොහැකි වූ පොස්පේට්, ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වයට ලක්කර කෙටි කාලීන බෝගවගාවන් සඳහා නිර්දේශිත නිෂ්පාදනයක් බවට පත් කිරීමට "රයිසොසාර" නව නිපැයුම සමත් වූ අතරම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්ෂේත්‍ර පර්යේෂණ (field trials) වලින් ද ඒ බව තහවුරු වී ඇත.

ඒ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හරහා මෙම "රයිසොසාර" නිෂ්පාදනය අක්කර 6000 ක වගාබිම් සඳහා යොදා ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.

ප්‍රායෝගික ප්‍රතිඵල පෙන්වමින් ගොවි අස්වැන්න තහවුරු කර ඇති "රයිසොසාර" නිෂ්පාදනය, වැඩි වෙමින් පවතින ඉල්ලුමට අනුව එහි නිෂ්පාදන ධාරිතාව ටොන් 20 සිට 100 දක්වා වැඩි කිරීමට පියවර ගෙන තිබීම සතුටුදායක කරුණකි. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් ලබාදුන් රුපියල් මිලියන 5.8 ක මූල්‍ය සහාය සමඟ සිය අප්‍රතිහත ධෛර්ය මුසු කළ සිහලිදු රන්වල නම් වූ මෙම නව නිපැයුම්කරු සිය නව කර්මාන්තශාලාව ඇඹිලිපිටිය ප්‍රදේශයේදී නුදුරේදීම විවෘත කිරීමට සුදානමින් සිටී.

මෙම ක්‍රියාදාමය සාර්ථක කර ගැනීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ මෙන්ම ලේකම්තුමාගේ ආශිර්වාදය සහ නොමද සහයෝගය කොමිසම වෙත හිමිව තිබීම පැසසිය යුතු ය. එය අනාගත ශ්‍රී ලංකාව විදෙස් වෙළඳපොළ ජයගනිමින් විදේශ විනිමය අර්බුදයට සවිමත් අත්වැලක් සපයන සුභවාදී පිවිසුමක් වනු ඇති බවට විශ්වාසය. දේශීය සම්පතක් වන පොස්පේට් සඳහා කිසිදු අගය එකතු කිරීමකින් තොරව විදේශයන් වෙත අපනයනය කර නැවත අධික විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරමින් පොහොර ලෙස ලංකාවට ආනයනය කිරීමේ සංස්කෘතිය වෙනස් කිරීමට තරම් "රයිසොසාර" නව නිපැයුම සමත් වෙනු ඇත.

2.5.2 නව නිපැයුම්කරු වෛද්‍ය එන්. ආර්. බී. නිශ්ශංක - ස්වභාවික ශාකසාර මදුරු දියරය සහ බාම්

වෛද්‍ය එන්. ආර්. බී. නිශ්ශංක මහතා සඳහා රුපියල් එක්ලක්ෂ පනස් දහසක ණය මුදලක් නිර්දේශ වූ අතර එම ණය මුදල නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය වන යන්ත්‍රයක් කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් මාස 3ක කාලයක් ලබා දෙන ලදී.

එමඟින් නිපදවූ නිෂ්පාදන ලංකාවේ ප්‍රමුඛ පෙළේ සුපිරි වෙළඳ ජාලයක් වන ස්පාර් ශ්‍රී ලංකා (Spar Sri Lanka) වෙළඳ ජාලය වෙත හඳුන්වා දී ඇති අතර මේ වන විට සාර්ථකව අලෙවිවෙමින් පවතී.

2.6 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers)

1979 අංක 53 දරණ නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත ප්‍රකාරව කොමිසම තුලම පර්යේෂණාගාරයක් පවත්වාගෙන යාම සඳහා කටයුතු සම්පාදන කිරීමට අවශ්‍යව තිබුණද ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසාගැනීමේ අපහසුතාවයන් හේතුවෙන් විකල්ප ක්‍රමවේදයන් හරහා එම අවකාශ සපුරාලීමට කොමිසම කටයුතු යොදා ඇත. තාක්ෂණික බීජෞෂණාගාර ස්ථාපිත කිරීම එහි එක් පියවරකි. ඒ හරහා ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට වඩාත් පහසු ආකාරයෙන් නව නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීමට පියවර ගෙන ඇත.

ඒ අනුව කොමිසමේ පූර්ණ මැදිහත්වීම මත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන හතරක් ජා-ඇල ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි, යාපනය විශ්වවිද්‍යාලයෙහි, රජරට විශ්වවිද්‍යාලයෙහි හා රුහුණ විශ්වවිද්‍යාලයෙහි ස්ථාපිත කරන ලදී.

ඊට අමතරව 2022 වසරේදී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය තුල නව තාක්ෂණික මධ්‍යස්ථානයක් පිහිටුවීම හරහා ද ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් වෙනුවෙන් තාක්ෂණික සහයෝගය ලබාදීමේ කර්තව්‍යය වෙනුවෙන් පෙර මං තනා ඇත.

එමඟින් ශ්‍රී ලාංකිය නව නිපැයුම්කරුවන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට හා පාසල් නව නිපැයුම්කරුවන්ට තම සංකල්පමය අදහස් හා ප්‍රාථමික නව නිර්මාණ, වෙළෙඳපොල ජයගතහැකි නිපැයුම් දක්වා වැඩිදියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික විශේෂඥයින්ගේ සහාය මෙන්ම බීජෞෂණ මධ්‍යස්ථානයේ පහසුකම් ද ලබාගත හැක.






2.7 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ BCS the Chartered Institute for IT Sri Lanka Section සහයෝගීතාවය

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පදනම් කරගනිමින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ නව නිපැයුම් දිරිගැන්වීම සඳහා BCS (British Computer Society) the Chartered Institute for IT Sri Lanka Section සමඟ නවෝත්පාදන වැඩසටහනක් පැවැත්වීමට කොමිසම කටයුතු කටයුතු කරන ලදී. මෙහි මූලික පරමාර්ථය වුයේ COVID- 19, ගංවතුර, සාගත, නියඟ වැනි ඕනෑම ව්‍යසනයක් හඳුනා ගැනීම, වැළැක්වීම, පාලනය කිරීම හෝ සහන සැලසීම සඳහා අවශ්‍ය නවීනතම තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිෂ්පාදන සහ නවෝත්පාදන හඳුනා ගැනීමය.


මෙහිදී ජයග්‍රාහයකයින්ව ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී සම්මානලාභීන් ලෙස ඇගයීමට ලක් කෙරුණු අතර මෙමගින් ඔවුනට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධ අන්තර්ජාතික තරඟ සඳහා සහභාගී වීමට මංපෙත් විවර විය. ඉදිරියේදී ද මෙම හවුල්කාරිත්වය පදනම් කර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ නවෝත්පාදන වල ප්‍රගමනය වෙනුවෙන් කටයුතු කිරීමට අපේක්ෂිතය.



2.8 කෘෂිකර්මයට අදාළ නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සිදුකරන, සාර්ථක ව්‍යවසායකයින් වීමට කෘෂිකර්මාන්තය සම්බන්ධ නවෝත්පාදකයින් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - 2022 යටතේ එම නවනිපැයුම්කරුවන් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම්කිරීම සබන්ධව දැනුවත්කිරීමේ වැඩසටහනක් zoom තාක්ෂණය ඔස්සේ 2022.12.21 දින පවත්වන ලදී.

පේටන්ට් බලපත්‍රයට අයදුම්කිරීමේදී සහ දැනට පේටන්ට් බලපත්‍රයට අයදුම්කර ඇති නව නිපයුම්කරුවන් හට ඒ සම්බන්ධයෙන් මතුවී ඇති ගැටළු නිරාකරණය කර දෙමින් සාර්ථකව පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය මනා දැනුමක් ලබා දීමට කටයුතු සලස්වන ලදී.



2.9 රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

රජයේ අරමුදල් මතම යැපෙමින් නව නිපැයුම්කරුවන් වෙත සහයෝගය ලබාදීමේ සංකල්පයෙන් ඔබ්බට යමින් රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම ආයතන සමඟ සහයෝගයෙන් නව නිපැයුම් සංවර්ධනය කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා වන කොමිසමේ සංකල්පය මත තවත් එක් නව නිපැයුමක් වාණිජකරණය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුව (NDB PLC) සමඟ සාර්ථකව වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

බුද්ධිමය දේපළ අයිතිය සුරකිමින් රාජ්‍ය මුදල් භාවිතයෙන් තොරව පරිසර සංරක්ෂණය සහ පරිසර හිතකාමී කාණ්ඩයට අදාළ නව නිපැයුම් දෙකක් සඳහා සහයෝගය ලබා දීමට කොමිසමට හැකි විය.

2021 වර්ෂයේ දී මෙම වැඩසටහන සඳහා නව නිපැයුම් 25 කට අවස්ථාව සලසා දෙමින්, කොමිසම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත් ඒ අතරින් එම අවස්ථාව ලබාගැනීමට ඉදිරිපත් වූ නව නිපැයුම්කරුවන් ගේ ඉල්ලීම් සහ ඉදිරිපත් වීම මත ජාතික සංවර්ධන බැංකුව (NDB PLC) වෙත යොමු කරන ලදී. ඒ අතරින් 2021 වර්ෂයේ දී නව නිපැයුම් 08 ක් ඇගයීමට ලක් කර, එක් නව නිපැයුමක් සඳහා මූල්‍යාධාරයක් ලබා දීමට කටයුතු කරන ලදී. එම වැඩසටහනේ දෙවන අදියර යටතේ 2022 වසර තුළදී "EMSOL ඉන්ධන ප්‍රතිකාරකය" (EMSOL Fuel Additive) නමැති නව නිපැයුම සඳහා රුපියල් 500,000/- ක මූල්‍යාධාරයක් ලබා දීමට ජාතික සංවර්ධන බැංකුව (NDB PLC) ඉදිරිපත් විය.

2.10 නව නිපැයුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු

නව නිපැයුම්කරණය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමේ දී විවිධ පාර්ශව/ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් සඳහා ද විශේෂ ස්ථානයක් හිමි වේ. මෙම වැඩමුළු හරහා නව නිපැයුම්කරණය පිළිබඳව දැනුවත් වීමට මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට ද එම වැඩසටහන් සඳහා සහභාගීවන්නන් හට අවස්ථාව සැලසේ.

සාම්ප්‍රදායික දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් ඔබ්බට යමින් නව නිපැයුම්කරණය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබාගත හැකි වන අයුරින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන් 2022/03/11 වන දින මප/කොත්/ ඩෙල්ටා ගැමුණුපුර මහා විද්‍යාලය, 2022/10/28 වන දින ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය (ජාතික පාසල), 2022/03/10 වන දින බ/ ගිරාඳුරුකෝට්ටේ මධ්‍ය මහා විද්‍යාලය සහ 2022/10/14 වන දින තලාව ජාතික පාසල යන පාසල් තුල දී පැවැත්විණ. මෙම වැඩසටහන් හරහා 1000කට අධික පාසල් සිසුන් පිරිසක් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

2.11 ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් සඳහා වූ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ පාඨමාලාව

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය එක්ව ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් සඳහා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ දින 03ක පාඨමාලාවක් හැදෑරීමට අවස්ථාව සලසා දෙන ලදී.

සිය නව නිපැයුම්කරණ අවශ්‍යතා සඳහා ඉවහල් වන ඉලෙක්ට්‍රොනික විද්‍යාවේ මූලික කරුණු පිළිබඳව දැනුම ලබාගැනීම සඳහා ප්‍රථම අදියර යටතේ ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් 15කට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් අවස්ථාව ලබාදෙන ලදී.

මෙම වැඩසටහන නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ අතර, සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රුපියල් පහළොස් දහසක් (15,000/-) විය. තෝරාගන්නා ලද නව නිපැයුම්කරුවන් වෙත අප කොමිසම මඟින් රුපියල් දස දහසක් (10,000/-) වටිනා මූල්‍යමය සහයෝගයක් ලබා දුන් අතර, නව නිපැයුම්කරුවන් විසින් රුපියල් පන් දහසක මුදලක් දරන ලදි.

2.12 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම

පාසල් සිසුන් හා විශ්වවිද්‍යාල මෙන්ම තෘතීයික අධ්‍යාපන ආයතනයන්හි සිසුන් අතර නව නිපැයුම්කරණයට ආකර්ශනයක් ඇති කරවමින් ඒ හරහා අධ්‍යාපන ක්ෂේත්‍රය තුල නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් නව නිපැයුම් සමාජ ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි. 2022 වර්ෂයේ පාසල් නව නිපැයුම් සමාජ 132 ක් පිහිටුවා ඇති අතර විශ්වවිද්‍යාල නව නිපැයුම් සමාජ 5ක් පිහිටුවා ඇත.

නව නිපැයුම් සමාජ පවත්වාගෙන යෑමේදී අවශ්‍ය උපකරණ මිල දී ගැනීම හා පාසලේ නව නිපැයුම් ප්‍රවර්ධන කටයුතු, නව නිපැයුම් ප්‍රදර්ශන පැවැත්වීම, දේශන වැනි දෑ සංවිධානය වෙනුවෙන් එම පාසල් නව නිපැයුම් සමාජ සඳහා රු. 10,000/= බැගින් මූල්‍යාධාරයක්ද ලබාදීමට කටයුතු කර ඇත.

මෙම නව නිපැයුම් සමාජ හරහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වැඩසටහන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වන නව නිපැයුම්කරුවන් ගේ නව නිපැයුම් සඳහා අවශ්‍ය බුද්ධිමය දේපළ අයිතිය ලබාගැනීමට අවශ්‍ය උපදෙස් හා සහයෝගය මෙන්ම ප්‍රාථමික තත්ත්වයේ නව නිපැයුම් වෙළෙඳපොල ජයගත හැකි තත්ත්වය දක්වා දියුණු කළ හැකි තාක්ෂණික සහයෝගය මෙන්ම නව නිපැයුම් වාණිජකරණයට අවශ්‍ය සහයෝගය ලබාදීම වෙනුවෙන් ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම නිරන්තරයෙන් සැදී පැහැදී සිටියි.

වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සහ වව්නියා විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල පහ (05) මෙන්ම ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය තුල ද නව නිපැයුම් සමාජ බිහිකර ඒවා ප්‍රවර්ධනයට කටයුතු කර ඇත.


2.13 යොවුන් නව නිපැයුම් දිරිගන්වන “Sri Lanka Inventors Commission” YouTube වැනලය සහ Facebook පිටුව

Youtube සහ සමාජ මාධ්‍ය (Social Media) වැනි නව ප්‍රවණතා යොදා ගනිමින් මෙම වේදිකාව හරහා නව නිපැයුම්කරුවන්ගේ නව නිර්මාණ මෙන්ම විවිධ ක්ෂේත්‍රයන් හි දැනුම බෙදා හදා ගැනීමට කටයුතු සලස්වා ඇත.

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලභා කර දීමත්, දෙස් - විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ නව වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ඇතුළු බොහොමයක් තොරතුරු පිළිබඳව නිසි අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබාගැනීමටත් මෙම වැනලය හරහා අවකාශ සලසා දී තිබේ.


ඒ අනුව යූ ටියුබ් නාලිකාවට වීඩියෝ 160 කට වඩා වැඩි ප්‍රමාණයක් සහ ග්‍රාහකයින් 1800 ක් දැනටමත් ඇතුලත්ව තිබීම සතුටුදායක ප්‍රගතියකි.

මෙමඟින් නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, සම්පත් දායකයින්ගේ මහ පෙන්වීම ලබා දීම සහ නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීම, නව තාක්ෂණික දැනුම ලබාදීම සහ පාසල් සිසුන් අතර දැනුම පරතරය අවම කිරීම වැනි තවත් විශේෂ ප්‍රතිලාභ රැසක් ලබා ගත හැකිය.



නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ Facebook පිටුව 2022 වර්ෂයේ අවසානය වන විට 6,900 ක් දක්වා ග්‍රාහකයින් පිරිසක් වර්ධනය වී තිබේ. මේ හරහා නව නිපැයුම් පිළිබඳ ප්‍රචාරණ කටයුතු ඉතා කාර්යක්ෂමව සිදුකරමින් පවතී.





2.14 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් 2022 වර්ෂය තුල පැවැත්වූ පළාත් දැනුවත්කිරීමේ වැඩසටහන් හා සමගාමීව පේටන්ට් පිළිබඳව දැනුවත් කිරීම සඳහා දිවයින පුරා වැඩසටහන් 09ක් අනුරාධපුර, කුරුණෑගල, මහනුවර, රත්නපුර, බදුල්ල, පොළොන්නරුව, පුත්තලම, නුවරඑළිය, මොණරාගල දිස්ත්‍රික්ක තුලදී සිදුකෙරිණි.

තව ද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල සමඟ පැවති දැනුවත්කිරීමේ වැඩසටහන් ඔස්සේ ද පේටන්ට් පිළිබඳ දැනුම බෙදා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

ඊට අමතරව විවිධ වැඩසටහන් වලදී මෙන්ම විවිධ අවස්ථා වලදී කොමිසම සමඟ සම්බන්ධ වූ නව නිපැයුම්කරුවන් සඳහා 2022 වර්ෂය තුලදී පේටන්ට් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සඳහා තාක්ෂණික සහායන් අවස්ථා 11කදී ලබාදුන් අතර, 2022 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය හා කොමිසම එක්ව ක්‍රියාත්මක කරන ලද කෘෂි නවෝත්පාදන බලගැන්වීමේ ව්‍යාපෘතිය ඔස්සේ ද ඒ හා සම්බන්ධ වූ නව නිර්මාණකරුවන් හට පේටන්ට් සම්බන්ධ මූලික දැනුවත්කිරීමේ වැඩමුළුවක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද පවත්වන ලදී.

2.15 ජාත්‍යන්තර රටවල පේටන්ට් අයදුම් කිරීම සඳහා සහාය ලබාගැනීමේ ක්‍රමවේදය

දේශීය නව නිර්මාණකරුවන් තම නව නිර්මාණ සඳහා ජාත්‍යන්තර රටවල පේටන්ට් බලපත්‍ර අයදුම් කරනු ලබන අවස්ථාවලදී හෝ පේටන්ට් සහයෝගීතා ගිවිසුම යටතේ තම බුද්ධිමය දේපළ අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කරනු ලබන අවස්ථා වලදී, ඒ සම්බන්ධයෙන් ඔවුනට වැයවන මුදල් ප්‍රතිපූරණය කරගැනීමට මෙන්ම එම කටයුතු වෙනුවෙන් කරනු ලබන ව්‍යක්තීය ගෙවීම් වෙනුවෙන් මුදලින් රු. 100,000.00 දක්වා ප්‍රතිපූරණය කරගැනීමට කොමිසම ප්‍රතිපත්තීමය තීරණයක් වශයෙන් අවස්ථාව සලසා දී ඇත.

එහිදී එම නව නිර්මාණය සඳහා ජාත්‍යන්තර වශයෙන් පේටන්ට් හෝ පේටන්ට් සහයෝගීතා ගිවිසුම ලබා ගැනීම වෙනුවෙන් කොමිසම මගින් වැයකරන්නට යෙදෙන මුදල වියදමක් ලෙස සැලකීම වෙනුවට විදේශ විනිමය වශයෙන් නැවත මෙරටට ලබාගත හැකිවන ආයෝජනයන් ලෙස සලකා කොමිසම කටයුතු කරන අතර, රාජ්‍ය මුදල් යෝග්‍ය ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාවට නංවා ඇත.

2.16 කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම්

2.16.1 නවෝත්පාදන විසඳුම් තුළින් මිනිසුන් හා වන ජීවීන් අතර ඇති වන ගැටීම් අවම කිරීම සඳහා ව්‍යාපෘති

වර්තමානයේ සුලභ ගැටළුවක් බවට පත්ව ඇති වන ජීවීන් හා මිනිසුන් අතර ගැටළු අවම කිරීම සඳහා ස්ථිරසාර විසඳුම් සම්පාදනය කිරීමේ අභිප්‍රාය ඇතිව කොමිසම විසින් මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

මිනිසුන් හා වන ජීවීන් අතර ඇතිවන ගැටුම් හේතුවෙන් දේශීය ආර්ථිකයට සිදු වන හානිය අතිමහත් ය. මෙම ගැටුම් අවම කිරීම උදෙසා අවශ්‍ය තාක්ෂණික උපකරණ ආනයනය සඳහා විශාල මුදලක් වාර්ෂිකව වැය කළ යුතු ය. මෙම ගැටලු සඳහා නව නිපැයුම් තුළින් විසඳුම් ලබාදෙමින් දේශීය ආර්ථිකය නහා සිටුවන අතරතුර මිනිසුන් හා වන ජීවීන් අතර ඇතිවන ගැටුම් සඳහා දිගු කාලීන හා තිරසාර විසඳුම් ලබා දීමට කොමිසම විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා එක්ව මහවැලි කලාපයන් තුළ පවතින විදුලි වැට දේශීය නව නිපැයුම් මඟින් බල ගන්වා, මහවැලි කලාපයන් තුළ මිනිසුන් හා වන ජීවීන් අතර ඇති වන ගැටුම් අවම කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක්ම 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී. මෙමඟින් දේශීය නව නිපැයුම් වාණිජකරණය කිරීම ප්‍රධානතම අරමුණ වන අතර, තවත් අරමුණක් වන්නේ වන ජීවීන් මඟින් සිදු වන වගා හානි ඇතුලු දේපළ හානි හේතුවෙන් දේශීය ආර්ථිකයට සෘජු සහ වක්‍රාකාරයෙන් අහිමි වන සම්පත් ප්‍රමාණය අවම කිරීම යි.

මෙම අරමුණු මත පදනම්ව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක්ව දෙවන අදියර ලෙස මහවැලි "බී" කලාපයේ ක්‍රියාත්මක කරන ලද දෙවන නියමු ව්‍යාපෘතිය වන "කරපොළ - කන්දකාඩු - සිංහපුර" අතර කිලෝමීටර 14 ක පමණ දිගකින් යුතු විදුලි වැට දේශීය නව නිපැයුම් මඟින් 2022 වර්ෂයේදී බල ගන්වන ලද අතර, මේ වන විටත් සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

2.16.2 තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායක නායකත්ව සංවර්ධන වැඩසටහන (Young Inventors – Entrepreneur Lead Development - YIELD)

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දැයේ පාසල් තුල නව නිපැයුම් කුසලතාවයන් ඔප් නැංවීමේ අරමුණින් ලෝකයෙහි පවතින නවීන තාක්ෂණයක් වන පරිගණක මෘදුකාංග භාවිතා කරමින් නව නිපැයුම් නිර්මාණය, ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම හා 3D මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් එය සැබෑ නිර්මාණයක් බවට පත්කිරීම සඳහා "පාසල් තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායක නායකත්ව සංවර්ධන වැඩසටහන" හරහා නව නිපැයුම් තරඟ පැවැත්වීමට කටයුතු කර ඇත.

PANACEA SOLUTIONS (PVT) LTD ආයතනය හා එක්ව සිදු කරන මෙම වැඩසටහන හරහා නොමිලේ ලබාදෙන පරිගණක මෘදුකාංග භාවිතා කරමින් මූලද්‍රව්‍ය සඳහා වන වියදම, නිෂ්පාදනය කිරීම සඳහා වන යන්ත්‍ර සූත්‍ර, ඒ සඳහා වන වියදම හා ශිල්පීය දැනුම මෙන්ම නව නිපැයුමෙහි ක්‍රියාකාරීත්වය පරිගණක මෘදුකාංග භාවිතා කරමින් පරීක්ෂා කරමින් නැවත නැවත නව නිපැයුමේ වැඩිදියුණු කිරීම් සිදුකරමින් නව නිපැයුම්කරුගේ මුදල් හා කාලය ඉතුරුකර ගැනීමට හැකිවීම නවීන තාක්ෂණික ක්‍රමවේදයේ සුවිශේෂී බවකි. නව නිර්මාණයක් සිදුකරන ආකාරය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීමටත් ඒ ආශ්‍රිතව තරඟයක් පැවැත්වීමට කොමිසම අපේක්ෂා කරයි.





ඒ අනුව, 2021 වර්ෂයෙහි පැවති කොරෝනා ව්‍යසනය හමුවේ ශ්‍රී ලංකාවෙහි පළාත් නවය ආවරණය කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදුකළ අතර, අපගේ YouTube නාලිකාව ඔස්සේ පරිගණක මෘදුකාංග භාවිතා කරමින් නව නිර්මාණකරනය පිළිබඳව වීඩියෝ හයක් එළිදක්වා ඇත.

2022 වර්ෂයේ ශ්‍රී ලංකාවෙහි පළාත් නවය ආවරණය කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක්ද භෞතිකව සිදු කළ අතර අපගේ YouTube නාලිකාව ඔස්සේ පරිගණක මෘදුකාංග භාවිතා කරමින් නව නිර්මාණකරණය සිදුකරන ආකාරය පිළිබඳව තවත් විඩියෝවක් එළිදක්වා ඇත.

තරඟය සඳහා නිර්මාණ අදහස් 700ක් පමණ මූලිකව යොමුව ඇති අතර, පරිගණක මෘදුකාංග භාවිතා කරමින් නව නිපැයුම් 80ක් නිර්මාණය කර ඇත.

2.17 නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම

නව නිපැයුම් ප්‍රචලිත කිරීමත්, ඒවාට නිසි ඇගයීමක් ලබාදීම හරහා දේශීය නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමත් අරමුණු කරගනිමින් නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු කරනු ලබයි.

ජනාධිපති සම්මාන විනිශ්චයන් සඳහා පාදක කරගනු ලබන්නේ පේටන්ට් බලපත්‍ර (බුද්ධිමය දේපළ අයිතිය) හිමි නව නිපැයුම් ය. මෙහිදී, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන පේටන්ට් බලපත්‍රලාභී නව නිපැයුම් පිළිබඳ ලේඛනය පදනම් කරගනිමින් තරඟය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන විනිශ්චයමණ්ඩලයක් වෙතින් ඇගයීම් කටයුතු සපුරාලීම සිදු කෙරෙයි.

මහජන ආරක්ෂාව සුබසාධනය හා ජාතික ආරක්ෂාව, ආහාර තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය, පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ, පරිසර සංරක්ෂණය, රසායන විද්‍යාව, සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය, බලශක්තිය, ප්‍රවාහන, ඉංජිනේරු යනාදී වූ තාක්ෂණික ක්ෂේත්‍ර දාහතරක් (14) ආවරණය කරමින් නව නිපැයුම් විනිශ්චයන් පැවැත්වෙන අතර, ඒ ඒ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාලව විනිශ්චය නිර්ණායකයන් උපරිමයෙන් සපුරාලන නව නිපැයුම් සඳහා විනිශ්චය මණ්ඩල තීරණය අනුව රන්, රිදී, ලෝකඩ මෙන්ම කුසලතා සම්මාන ද පිරිනමනු ලබයි. තව ද මෙම තාක්ෂණික ක්ෂේත්‍ර සියල්ල අතරින් උපරිම ශක්‍යතාවය තහවුරු කරන නව නිපැයුම සඳහා එම වර්ෂයේ විශිෂ්ටතම නව නිපැයුමට හිමි ජනාධිපති සම්මානය පිරිනැමීම ද විශේෂත්වයකි.

ඒ අනුව, 2017, 2018, 2019 සහ 2020 යන වර්ෂයන්ට අදාලව පේටන්ට් බලපත්‍ර ලබාගත් නව නිපැයුම් වෙනුවෙන් ජනාධිපති සම්මාන පිරිනැමීමේ විනිශ්චය කටයුතු ආරම්භ කිරීමට මෙම වසරේ දී හැකියාව ලැබුණි. 2022 වර්ෂයේ දෙසැම්බර් 01 වන දින සිට නව නිපැයුම් විනිශ්චය කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව 2017 වර්ෂයට අදාලව නව නිපැයුම් 30ක්, 2018 සඳහා 38ක්, 2019 සඳහා 27ක් හා 2020 වර්ෂය සඳහා 40ක් වශයෙන් නව නිපැයුම් 135ක සංඛ්‍යාවක් ඇගයීම් සඳහා යොමු කර තිබේ. හතළිස් දෙදෙනෙකු ගෙන් සමන්විත සමස්ථ විනිශ්චය මණ්ඩලය සඳහා පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් දෙසැම්බර් 01 වන දින පවත්වන ලද අතර, දෙසැම්බර් 27 දින “ප්‍රවාහන”, 29 දින “රසායන විද්‍යාව” හා 30 වන දින “භෞතික විද්‍යාව” යනාදී වශයෙන් ක්ෂේත්‍ර ත්‍රිත්වයක විනිශ්චයන් අවසන් කිරීමට හැකියාව ලැබුණි. සෙසු තාක්ෂණික ක්ෂේත්‍රයන් හි විනිශ්චය කටයුතු ඉදිරි දිනයන් හි දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම විනිශ්චයන්හි විශේෂත්වය වන්නේ නව නිපැයුමක් විනිශ්චය කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව, දේශීය ආර්ථිකයට මෙන්ම නව නිපැයුම්කරුවාටද ප්‍රතිඵලදායක වන අන්දමේ නව නිපැයුම් හඳුනාගැනීමට පියවර ගෙන තිබීම යි.

2.18 නව නිපැයුම්කරුවන්ගේ හමුව

නව නිපැයුම්කරුවන් සමඟ අදහස් හුවමාරු කරගැනීමටත්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන නවතම වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීමත් අරමුණු කර ගනිමින් 2022.09.28 දින ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ශ්‍රවණාගාරයේ දී නව නිපැයුම්කරුවන් සමඟ හමුවක් සංවිධානය කරන ලදී.

2.19 විද්‍යා දිනය සැමරීම

2022 වර්ෂයේ නොවැම්බර් මස 10 සිට 16 වන දින දක්වා යෙදුනු විද්‍යා සතියට සමගාමීව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් දේශීය නව නිපැයුම්කරුවන්ගේ උන්නතිය උදෙසා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි (NERDC) ස්ථාපිත කර ඇති තාක්ෂණික බීජෞෂණාගාර මධ්‍යස්ථානය මඟින් නව නිපැයුම්කරුවන් හට ලබාගත හැකි සහයෝගයන් හා එහි කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2022.11.11 වන දින එම පරිශ්‍රයේදී පවත්වන ලදී.



2.20 අන්තර්ජාතික පිළිගැනීම

ගෝලීය වශයෙන් නව නිපැයුම් සහ නවෝත්පාදන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධව ලොව පිළිගත් **අන්තර්ජාතික නව නිපැයුම්කරුවන්ගේ සංවිධානය (IFIA)** හා **ලෝක නව නිපැයුම් සහ බුද්ධිමය දේපල සංවිධානය (WIIPA)** යන ජාත්‍යන්තර සංගම් දෙකෙහි සාමාජිකත්වය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත හිමි වී ඇත. ඒ හරහා කොමිසමේ ජාත්‍යන්තර සබඳතා තවදුරටත් වර්ධනය වී ඇත.

මෙම සාමාජිකත්වයන් ලබාගැනීම තුලින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට යොවුන්, විවෘත, කාන්තා යනාදී වූ විවිධ කාණ්ඩයන් නියෝජනය කරන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ රැසකට සහභාගී වීමේ දුර්ලභ අවස්ථාව හිමි වී ඇත. මෙම සංවිධාන මඟින් සිදු කරන සේවාවන් ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීම, නව නිපැයුම් වාණිජකරණය, බුද්ධිමය දේපළ අයිතිය සුරැකීම, පරිසර හිතකාමී නව නිපැයුම් ප්‍රවර්ධනය සහ නව නිපැයුම් මෙන්ම නව නිපැයුම්කරුවන්ගේ ව්‍යාපෘති සඳහා ප්‍රචාරණය ලබාදීම සිදු කරන අතර, ඔවුන් ගේ වෙබ් අඩවි හා සඟරා වැනි මුද්‍රිත මාධ්‍ය හරහා ද නව නිපැයුම් පිළිබඳ නවතම තොරතුරු ප්‍රචාරණය සිදු කරනු ලබයි. එමෙන්ම ජයග්‍රාහී නව නිපැයුම් සඳහා පදක්කම් හා ත්‍යාග මුදල් ද ප්‍රදානය කිරීම ද විශේෂත්වයකි.

ඒ හැරුණු විට තරඟ සඳහා ගුවන් ටිකට්පත්, නවාතැන් පහසුකම් වෙනුවෙන් අනුග්‍රහ දැක්වීම මෙන්ම නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා ලියාපදිංචිය, ප්‍රදර්ශන කුටි සැපයීම හා ප්‍රවාහන පහසුකම් සම්පාදනය යනාදී කටයුතු වල දී සහනශීලීව කටයුතු කිරීම මගින් ද සහයෝගය ලබාදෙයි. මෙම දිරිගැන්වීම් සහ පිළිගැනීම් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට ඔවුන් ගේ නව නිපැයුම් දේශීය හා විදේශීය වෙළෙඳපළ තුල වාණිජකරණය කිරීම වැනි කටයුතු සඳහා මහඟු පිටුවහලකි.

මෙම ජාත්‍යන්තර සංගම්වල අනුග්‍රහය මත කොමිසම වෙත ලැබෙන පහසුකම් ඔස්සේ සහසක් නිමැවුම් තරඟයේ ජයග්‍රාහකයින් ලොව පුරා පැවැත්වෙන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ අත්දැකීම ලබාගැනීමට සුදුසුකම් ලබයි.

2.21 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය

දේශීය නව නිපැයුම්කරුවන් ඇගයීම වෙනුවෙන් "නව නිපැයුම්කරුවන්ට වෙන්වූ දිනයක්" නම් කිරීමේ අවශ්‍යතාවය මත, අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් 2016 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මස 26 වන දිනය "ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය" ලෙසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම දිනයෙහි සුවිශේෂීතාවය වන්නේ විශිෂ්ට ගණයේ සිවිල් ඉංජිනේරුවරයෙකු, නව නිපැයුම්කරුවෙකු සහ ඉංජිනේරුමය ආයතන කිහිපයකම ප්‍රාරම්භකයා වූ එමෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධුරය හෙබ වූ දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමා ගේ ජන්ම දිනය එදිනට යෙදී තිබීමයි.

2.21.1 ජාතික නව නිපැයුම්කරුවන් ගේ දිනය ස්ථාපිත කිරීමේ අරමුණු

- නව නිපැයුම්කරුවන් ඇගයීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කිරීම හා නව නිපැයුම්කරණය කෙරෙහි ඔවුන් දිරි ගන්වමින් නවෝත්පාදන ආර්ථිකයක් කරා රට මෙහෙයවීම.
- නව නිපැයුම්කරුවන්ගේ දිනය ප්‍රකාශයට පත්කිරීම මඟින් නව ආයෝජන අවස්ථා ලබාදීම කෙරෙහි නව නිපැයුම්කරුවන් ගේ අවධානය ලබාගැනීම.
- නව සොයාගැනීම් තුළින් සංවර්ධිත ආර්ථිකයක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකීය නිපැයුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දීම.
- නව නිපැයුම්කරණය උදෙසා ජනතාව දිරිගැන්වීමට ප්‍රවේශයක් ලබාගැනීම.
- නව නිපැයුම්කරුවන් හා වඩාත් සමීපව කටයුතු කිරීම සඳහා කොමිසමට අවස්ථාවක් හිමි වීම.
- සම්මානනීය නව නිපැයුම්කරුවන් හඳුනාගැනීම.

2.22 SLIC-Huawei ICT Competition - තොරතුරු තාක්ෂණය හා සබැඳි නවෝත්පාදන තරඟාවලිය

විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ තොරතුරු තාක්ෂණ දැනුම ඉහළ නැංවීම හරහා ඔවුන් එම ක්ෂේත්‍රයේ නවෝත්පාදන කාර්යයන් වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා Huawei Technologies Lanka Company (Pvt) Ltd එක්ව තොරතුරු තාක්ෂණ නවෝත්පාදන තරඟාවලියක් සංවිධානය කරන ලදී. මෙහි ප්‍රථම අදියරේදී තරඟාවලිය පිළිබඳව සිසුන් දැනුවත් කිරීමට කටයුතු කළ අතර, එම වැඩසටහන 2022.01.04 දින පවත්වන ලදී. තරඟාවලිය 2022.02.12 වන දින පවත්වන ලද අතර, ඒ සඳහා සිසුන් 200කට අධික සංඛ්‍යාවක් සහභාගී විය. තරඟයේ ජයග්‍රාහකයන් ඇගයීම 2022.03.09 දින Huawei Technologies පරිශ්‍රයේදී පවත්වන ලදී.






2.23 නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ වෙනත් වැඩසටහන්

2.23.1 “Sri Lanka Inventors” - YouTube ප්‍රවේශය

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලභා කර දීමත්, දෙස් - විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ නව වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත් භාවයක් ලබා ගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ඇතුළු බොහොමයක් තොරතුරු පිළිබඳව නිසි අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබා ගැනීමටත් මෙම වැනලය හරහා අවකාශ සලසා දී තිබේ.

ඒ අනුව එම යූ ටියුබ් නාලිකාව තුල වීඩියෝ 100 කට වඩා වැඩි ප්‍රමාණයක් සහ ජයග්‍රාහකයින් 1200 ක් දැනටමත් ඇතුලත්ව තිබීම සතුටුදායක ප්‍රගතියකි.





2.23.2 නිල වෙබ් අඩවිය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නිල වෙබ් අඩවිය ඵලදායී ලෙස නව මුහුණුවරකින් යුතුව සංස්කරණය කර ඇත. මෙහිදී නව නිපැයුම්කරුවන්, ආයෝජකයන් මෙන්ම නවෝත්පාදනයට හිතැති ශ්‍රී ලාංකික ප්‍රජාව ගේ වැඩිමනත් ප්‍රයෝජනය උදෙසා පුළුල් සේවාවක් සැපයීම වෙනුවෙන් එය නිර්මාණය කර ඇත. කර්මාන්ත ක්ෂේත්‍ර පසුබිම් වූ ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් සොයන්නන් වෙනුවෙන් කොමිසමේ සම්බන්ධීකරණය යටතේ නව නිපැයුම්කරුවන් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව ද මෙම වෙබ් අඩවිය සතු වීම සුවිශේෂී වේ.



2.24 මාධ්‍ය දායකත්වය

ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් බිහිකිරීම උදෙසා දේශීය නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එබැවින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සෑම විටම ප්‍රචාරණ මාධ්‍ය (විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය) සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර, නවෝත්පාදන ප්‍රචලිත කිරීම සඳහා ස්වේච්ඡා සහයෝගය මාධ්‍ය වෙතින් ලබාගැනීමට ක්‍රියා කරයි.

2022 වර්ෂය තුල ද මාධ්‍ය ආයතන කිහිපයක් හා සම්බන්ධීරණය වෙමින් නව නිපැයුම්කරුවන්ගේ කොමිසම නව නිපැයුම් පිළිබඳව ප්‍රචාරණය කිරීම සඳහා අවසරය ලබා දෙන ලදී. ඒ අනුව අක්ෂරය PEO TV නාලිකාව සමඟ වැඩසටහන් තුනක් ක්‍රියාත්මක කරන ලදී.

2.25 SLIC - SPAR Sri Lanka ව්‍යාපෘතිය

වර්තමානයේ පවතින විදේශ විනිමය ගැටළුව සඳහා නවෝත්පාදන මත පදනම් වූ ආර්ථිකයක් කරා ගමන් කිරීම යනු වඩාත් යෝග්‍ය විසඳුමකි. දේශීය නව නිපැයුම්කරුවන් හඳුනාගනිමින්, එම නිපැයුම් වැඩිදියුණු කිරීමට සහයෝගය ලබාදෙමින්, ඔවුන් සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොල ප්‍රවේශය සකස් කරදීම කොමිසම මඟින් මෙම විසඳුම යථාර්තයක් බවට පත් කිරීමට කොමිසම කටයුතු කරනු ලබයි. නව නිපැයුම්කරුවන් ව්‍යවසායකයින් බවට පත් කරමින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමත්, එමඟින් ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සෘජු දායකත්වයක් ලබාදීමත් වැනි පුමුඛ අරමුණු සාක්ෂාත් කර ගනිමින් ජාතික ආර්ථිකයට උරදීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට මේ වනවිට හැකියාව ලැබී තිබීම සතුටට කාරණයකි.

එහි මූලික අදියර ලෙස ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමත්, ස්පාර් ශ්‍රී ලංකා (SPAR-Sri Lanka) සුපිරි වෙළෙඳසැල් ජාලයත් එක්ව ක්‍රියාවට නැංවූ දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් වෙළෙඳපළට හඳුන්වාදීමේ නව ව්‍යාපෘතිය 2022 වර්ෂයේ SPAR Sri Lanka සුපිරි වෙළඳ සැල් ජාලයෙහි තලවතුගොඩ පිහිටි ප්‍රධාන ශාඛාවෙහි දී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදී. මෙහිදී මූලික අදියර වශයෙන් නව නිපැයුම්කරුවන් සිවු දෙනෙකුගේ (04) නිෂ්පාදන දාහතරක් (14) වෙළෙඳපළට හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාව තුල දැනට SPAR Sri Lanka සුපිරි වෙළෙඳ සැල් ශාඛා 10 ක් ලෙසින් ජාල ගතව විහිදී පවතින අතර, ලොව පුරා රටවල් 48කට ශාඛා 13600ක අධික ප්‍රමාණයක් මේ වන විටත් සක්‍රීයව පවතින හෙයින් දේශීය නව නිපැයුම් “Made in Sri Lanka” සන්නාමය යටතේ විදෙස් වෙළෙඳ පොළ තුල ප්‍රචලිත කරවීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ඒකායන අරමුණයි.









2.26 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් උපරිම සේවාවක් සැලසීම උදෙසා සුවිසල් මෙහෙවරක නිරත වන ආයතනයකි. නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලබාදෙන එම සේවාව ගුණාත්මක හා කාර්යක්ෂමතාවයෙන් ඉහළ සේවාවක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ඉහළ නැංවීම ද අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, ඔවුන් විෂයානුබද්ධව විවිධ පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත.

පහත දැක්වෙන්නේ 2022 වසර තුළ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය වෙනුවෙන් සහභාගීත්වය ලබා දුන් වැඩසටහන් පිළිබඳ තොරතුරු ය.

- නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ "Microsoft Excel Training for Data Analysis" සම්බන්ධ වැඩමුළුව සඳහා කොමිසමේ නිලධාරීන් තිදෙනකු සහභාගී විය.

- මාර්ග ගත තාක්ෂණය (online) ඔස්සේ නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වන ලද "Project Management" වැඩමුළුව සඳහා කොමිසමේ එක් නිලධාරියෙකු සහභාගී විය.

- The Institute of Engineers Sri Lanka ආයතනය මඟින් පවත්වන ලද "Finance for Engineers Fundamentals of Corporate Finance" පාඨමාලාව සඳහා කොමිසමේ අධ්‍යක්ෂතුමා සහභාගි විය.

- නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ "පුද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම" සම්බන්ධ වැඩමුළුව සඳහා කොමිසමේ එක් නිලධාරිනියක් සහභාගී විය.

- මාර්ග ගත තාක්ෂණය (online) ඔස්සේ නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ "සංවර්ධන නිලධාරීන් සහ කළමණාකරණ සහකාර නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සම්බන්ධ වැඩමුළුව" සඳහා කොමිසමේ එක් නිලධාරිනියක් සහභාගී විය.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
මූල්‍ය තත්ත්ව විස්තරය

දෙසැම්බර් 31 න් අවසන් දිනට	සටහන්	2022	2021
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	**67,662,970**	62,331,856
උත්සව අත්තිකාරම්		**1,250**	1,250
ණයගැතියෝ	2	**15,337,063**	11,396,880
ජාතික ආධුනිකත්ව සහ පුහුණු අධිකාරිය වෙතින් ලැබීම්		**7,560**	7,560
වෙනත් අත්තිකාරම්		**136,633**	136,633
ඉදිරියට කල ගෙවීම්	3	**520,856**	1,468,653
(අඩු කළා) අඩමාන ණයකරුවන් සඳහා වෙන්කිරීම් (100%)	4	**(9,602,964)**	(9,602,964)
වෙනත් ලැබිය යුතු දෑ		**167,930**	-
නැවත ලැබිය යුතු තැන්පතු	5	**2,407,000**	2,407,000
ආපදා ණය		**805,962**	917,399
COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය		**646,960**	722,718
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල යටතේ ලබාදුන් ණය		**754,820**	707,548
IAFM-SL ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය		**2,660,400**	4,500,000
ඉන්ධන තැන්පතු		**100,000**	100,000
ටී ෂර්ට් තොග	6	**320,280**	414,480
ලිපි දුව්‍ය තොග	6	**595,115**	386,860
		82,521,834.64	**75,895,873**
ජංගම නොවන වත්කම්			
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල යටතේ ලබාදුන් ණය		**1,180,141**	1,737,658
COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය		**-**	237,729
IAFM-SL ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය		**3,672,600**	1,500,000
ආපදා ණය		**2,499,927**	2,953,058
දේපළ, පිරියත හා උපකරණ	7	**39,780,730**	47,349,863
		47,133,398	**53,778,308**
මුළු වත්කම්		**129,655,233**	**129,674,181**
අරමුදල් සහ බැරකම්			
ජංගම බැරකම්			
ණයගිමියෝ	8	**2,160,664**	1,316,664
උපචිත වියදම්	9	**7,146,531**	2,201,973
		9,307,195	3,518,637
ජංගම නොවන බැරකම්			
මහාවැලි ව්‍යාපෘතිය සඳහා වෙන්කිරීම්	10	**6,558,705**	6,534,026
පාරිතෝෂික වෙන්කිරීම්	11	**4,423,824**	4,268,344
IAFM-SL ව්‍යාපෘතිය	12	**36,472,155**	36,472,155
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	13	**30,426,293**	37,921,883
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	14	**5,304,071**	9,905,989
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල	15	**12,837,184**	12,837,184
මුළු බැරකම්		**105,329,427**	**111,458,217**
ශුද්ධ වත්කම්		**24,325,806**	**18,215,964**
ශුද්ධ වත්කම්/ හිමිකම්			
සම්මුවිචිත අරමුදල		**2,825,806**	(3,284,036)
ප්‍රත්‍යාගණන අතිරික්තය		**21,500,000**	21,500,000
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		**24,325,806**	**18,215,964**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 41 සිට 45 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ඩී. ඒ. සරත්චන්ද්‍ර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.

මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු
කොමිසාරිස්

කල්පනී රාජපක්ෂ
සහකාර කොමිසාරිස්

2023 පෙබරවාරි 23
කොළඹ

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් දිනට	සටහන්	2022	2021
		රු.	රු.
ආදායම්			
රජයේ දායකත්වය			
රජයේ දායකත්වය - පුනරාවර්තන	16	49,400,000	40,370,000
ව්‍යාපෘති / වැඩසටහන්	20	9,018,748	10,107,926
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		85,500	533,750
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ස්ථාවර වත්කම්	7	5,567,670	1,686,650
තාක්ෂණ බීජෞෂණාගාර - යන්ත්‍ර හා උපකරණ	7	7,495,590	7,495,590
වෙනත් ආදායම්	17	1,638,282	1,243,843
මුළු ආදායම		**73,205,790**	**61,437,759**
වියදම්			
පුද්ගලික පඩිනඩි	18	20,692,859	19,424,172
ආයතන හා පරිපාලන වියදම්	19	24,871,009	25,010,573
ක්ෂය - ස්ථාවර වත්කම්	7	13,063,259	9,182,240
පාරිතෝෂික	11	554,030	585,730
නව නිපැයුම්කරුවන් දිරි දිරි ගැන්වීමේ වියදම්	20	9,018,748	10,107,926
වෙනත් වියදම්	21	13,436	560,943
මුළු වියදම්		**68,213,341**	**64,871,583**
වසර සඳහා අතිරික්තය / (හිඟය)		**4,992,449**	**(3,433,824)**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 41 සිට 45 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	සටහන්	ප්‍රත්‍යාගණන අතිරික්තය	සමුච්චිත අරමුදල	මුළු ස්කන්ධය
		රු.	රු.	රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය		-	149,787	149,787
2021 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		-	(3,433,824)	(3,433,824)
වාහන ප්‍රත්‍යාගණනය		21,500,000	-	21,500,000
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		21,500,000	(3,284,037)	18,215,962
පෙර වර්ෂයේ ගැලපුම් - 2021				
උපචිත වියදම් ගැලපීම නිවැරදි කිරීම		-	(3,272,372)	(3,272,372)
වෙක්පත් ලැබීම් - නිපුණතා සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා නවෝත්පාදන හා නව නිපැයුම් පුහුණු වැඩසටහන		-	49,520	49,520
ඉදිරියට කරන ලද ගිවිසුම්ගත සේවාවන් වල වැරදි නිවැරදි කිරීම			(50)	(50)
"අදහස් උත්පාදන මැදිරිය" වෙනුවෙන් කරන ලද ක්ෂය ගැලපීම නිවැරදි කිරීම		-	(10,467)	(10,467)
වර්ෂයේ පැවති වත්කම් වල ඵලදායී ජීව කාලය වෙනස්වීම් ගැලපීම්		-	4,134,762	4,134,762
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)		**21,500,000**	**(2,382,643)**	**19,117,355**
2022 ජනවාරි 01 දිනට ශේෂය		21,500,000	(2,382,643)	19,117,357
අවලංගු කරන ලද වෙක්පත්			216,000	216,000
2022 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		-	4,992,449	4,992,449
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**21,500,000**	**2,825,806**	**24,325,806**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 41 සිට 45 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්			
අතිරික්තය/හිඟය		4,992,449	(3,433,824)
මුදල් නොවන සංචලන			
ක්ෂයවීම්	7	13,063,259	9,182,240
ව්‍යාපෘති / වැඩසටහන් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් වල වෙනස් වීම	20	(9,018,748)	(10,107,926)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම සම්බන්ධ වෙනස්වීම්		(85,500)	(533,750)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය වීම් / ස්ථාවර වත්කම්		(13,063,259)	(9,182,240)
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම්	11	554,030	585,730
අපහරණයෙන් ලද ලාභය		13,436	560,943
ගැලපීම් :			
ණයගැතියන්වෙනස්වීම		(3,940,183)	(905,105)
ලිපි ද්‍රව්‍ය තොග වෙනස්වීම්		(208,255)	59,095
වී ෂර්ට් තොග වෙනස්වීම්		94,200	-
ඉදිරියට කල වියදම් හි වෙනස්වීම	3	947,797	(875,793)
උත්සව අත්තිකාරම් හිවෙනස්වීම		-	(1,250)
ගෙවිය යුතු වියදම් හි වෙනස්වීම		4,944,558	(163,536)
අනෙකුත් ලැබිය යුතු දෑ හි වෙනස්වීම්		(167,930)	10,000
ණයහිමියන්ගේ වෙනස්වීම		844,000	1,149,334
		(1,030,148)	(13,656,080)
පරිතෝෂික ගෙවීම්		(267,265)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(1,297,413)**	(13,656,080)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ			
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	7	(441,068)	(114,355)
මහවැලි ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වියදම්		(564,212)	(14,159,766)
වත්කම් විකිණීම		1,000	-
ණය නැවත ගෙවීම් -නව නිපැයුම්කරුවන්ගේ අරමුදල්		12,000	616,024
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් සඳහා වියදම්		-	(98,582)
ආපදා ණය ප්‍රදාන		(543,474)	(1,215,300)
ආපදා ණය නැවත ගෙවීම		1,108,042	773,303
වැරදි නිවැරදි කිරීම්		(54,973)	-
"COVID 19වැඩසටහන" ලබා යටතේ ලබා දුන් ප්‍රදාන		-	(160,120)
ණය ලබාදීම් අවලංගු කිරීම		-	805,000
"නව නිපැයුම් දිරිය වැඩසටහන" ලබා යටතේ ලබා දුන් ණය		-	(1,025,750)
අවලංගු කරන ලද චෙක්පත්		216,000	-
පෙර වර්ෂයට අදාලව මුදල් ලැබීම්		49,520	-
IAFM-SL වැඩසටහන යටතේ ලබා දුන් ණය නැවත ගෙවීම		2,136,800	-
IAFM-SL වැඩසටහන යටතේ ලබා දුන් ණය/ප්‍රදාන		(5,950,000)	(6,000,000)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(4,030,365)**	(20,579,548)
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
ප්‍රාග්ධන ප්‍රදාන		10,070,000	7,900,000
මහවැලි ව්‍යාපෘතිය		588,891	22,079,592
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය		**10,658,891**	29,979,592
වසර තුළදී ශුද්ධ මුදල් හා මුදල් සමාන දේ (වැඩි වීම/ අඩු වීම)		5,331,114	(4,256,036)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ		62,331,856	66,587,892
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ		**67,662,970**	**62,331,856**
මුදල් හා මුදල් සමාන දේ විශ්ලේෂණය			
A/C No.033-1-001-0-1791066		19,799,754	11,925,890
A/C No.033-1-001-2-1791065		45,510,115	48,954,908
A/C No.204402131791066		2,353,101	1,451,059
		67,662,970	62,331,856

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 41 සිට 45 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

අයවැය හා සංචිතයන් සංසන්දනය කිරීම

රු.

	අනුමත අයවැය		මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද අරමුදල්	
	2022	**2021**	**2022**	**2021**
පුනරාවර්තනය	**50,500,000**	46,000,000	**49,400,000**	40,370,000
ප්‍රාග්ධනය	**30,000,000**	17,500,000	**10,070,000**	7,900,000
එකතුව	**80,500,000**	**63,500,000**	**59,470,000**	**48,270,000**

වර්ෂය	රජයේ දායකත්වය ප්‍රාග්ධනය (ශ්‍රී. ලං. රු)
1991	163,050
1992	1,700,000
1993	-
1994	250,000
1995	196,000
1996	113,500
1997	757,000
1998	1,700,000
1999	290,000
2000	4,500,000
2001	2,870,000
2002	700,000
2003	2,500,000
2004	621,000
2005	5,997,000
2006	33,991,000
2007	37,100,000
2008	24,106,000
2009	15,765,000
2010	4,500,000
2011	6,151,010
2012	21,562,000
2013	17,061,000
2014	40,000,000
2015	30,269,992
2016	57,248,655
2017	73,133,822
2018	85,750,000
2019	58,000,000
2020	24,538,000
2021	7,900,000
2022	**10,070,000**

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පටිපාටීන්

1. කොමිසමේ තොරතුරු

1.1 ආයතනයේ වාර්තාව

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම් දිරි ගැන්වීමේ පනත යටතේ නව නිපැයුම් දිරිගැන්වීම , ප්‍රවර්ධනය හා නිෂ්පාදන සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

කොමිස ක්‍රියාත්ම වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතේය.

2023 වර්ෂයේ කොමිසමේ කාර්යාලය, 05 වන මහල, මෙහෙවර පියස ගොඩනැගිල්ල, කොළඹ 05 හි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අදාලව ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා වේ.

2.1. අනුකූලතා ප්‍රකාශනය

විගණකාධිපති සහ මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ කමිටුව විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදි.

මූල්‍ය ප්‍රකාශන වල පහත සඳහන් අංශ ඇතුලත් වේ.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය
- ්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව මූල්‍ය ප්‍රකාශන කස් කිරීම හා ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි.

2.3 ඇගයීම් කිරීමේ පදනම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇති අතර උද්ධමන සාධක සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු කර නොමැත.

2.4 ව්‍යවහාර මුදල් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරිත්වය

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනයේ ක්‍රියාකාරී මුදල් වේ. මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

2.5 ප්‍රමාණාත්මක බව, හිලව් කිරීම, වැටයිම් කිරීම

2.5.1 ප්‍රමාණාත්මක බව

සමාන අයිතමයන්හි ප්‍රමාණාත්මක අගයන් මුල්‍ය ප්‍රකාශයන්හි වෙන් වෙන්ව දක්වා ඇත. මුල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම පිලිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 1 මගින් අවසර ලබා දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවන අයිතමයන් ඒවායේ ස්වරූපය හා ක්‍රියාකාරීත්වයේ අසමානතාවය පදනම් කරගනිමින් වෙන් වෙන්ව මුල්‍ය ප්‍රකාශ දක්වා ඇත.

2.5.2 හිලව් කිරීම

රාජ්‍ය අංශයට ගිණුම්කරණ ප්‍රමිති වලට අවශ්‍ය පරිදි අවසර දී ඇත්නම් මූල්‍ය ප්‍රකාශන වලින් වත්කම් වගකිම් ආදායම් වියදම් හිලව් කිරීම නොකරයි.

2.5.3 වැටයිම් කිරීම

මූල්‍ය ප්‍රකාශන වල ඇති මුදල ආසන්නතම රුපියල් වලට එකතු කර ඇත.

2.6 සැලකිලිමත් වීම

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අදාළ කරුණු පදනම් කරගෙන වේ.

2.7 වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම්

වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම් යනු වාසිදායක හා අහිතකර සිදුවීම් වන අතර ඒවා වාර්තා කිරීමේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරණ ලද දිනය අතර වේ.

මේ සම්බන්ධයෙන් මෙම වර්ෂය සඳහා වාර්තා කිරීමේ කාලයෙන් පසුව කිසිදු සිදුවීමක් නොමැත.

3. විදේශ මුදල් ගණුදෙනු

ගණුදෙනු සිදුකරන අවස්ථාවේ පවත්නා විනිමය අනුපාතය අනුව සියළුම විදේශ විනිමය ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වේ.

4. දේපල හා උපකරණ

4.1 හඳුනා ගැනීමේ පදනම

දේපල හා උපකරණ යනු සේවා සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති ස්පර්ශ අයිතම වන අතර ඒවා වසරකට වැඩි කාලයක් තුල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

4.2 ඇගයීමේ පදනම

වත්කමක් ලෙස පිලිගැනීමට සුදුසුකම් ලබන දේපල හා උපකරණ අයිතමයක් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයෙනි. පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපනය වන වියදම් සහ එහි කොටසක් එකතු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත් වේ.

මිලදී ගන්නා ලද අදාල උපකරණ වල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන පරිගණක මෘදුකාංග වැනි දෑ එම උපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපල හා උපකරණ වල කොටස් වලට විවිධ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇති වීට, ඒවා දේපල හා උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන කොටස්) ලෙස ගණන් ගැනේ.

අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා විවිධ මූල්‍ය කාලසීමාව තුළ ලාභය හෝ අලාභය ප්‍රකාශනයට ගලපනු ලැබේ.

පවත්නා වත්කම් වල මෑතකදී තක්සේරු කරන ලද කාර්යසාධනයේ ප්‍රමිතියට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි නම් ප්‍රතිසංස්කරණය මගින් හඳුනා ගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරයි.

අදාල වත්කම් වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් කාලය තුල ප්‍රධාන අලුත්වැඩියාවන් ක්ෂය කරනු ලැබේ.

4.3 ප්‍රත්‍යාගණනය

2021 දෙසැම්බර් 31 දින සිට වාහන කාණ්ඩයේ වත්කම් සඳහා නැවත තක්සේරු කිරීමේ ආකෘතිය භාවිතා වේ. එම පන්තියේ වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට ඉදිරියට ගෙන යනු ලැබේ. ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය සංචිතයට ගලපා ඇත.

4.4 බැහැර කිරීම

දේපළ හා උපකරණ භාවිතා කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට එම වත්කම් බැහැර කිරීම සඳහා හඳුනා ගනි. බැහැර කිරීමෙන් හඳුනා ගන්නා වත්කම් වලින් ඇතිවන ලාභය හෝ අලාභය එම වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශනයේ වෙනත් ආදායම් හෝ වෙනත් වියදම් ලෙස ගලපනු ලැබේ. (වත්කම් බැහැර කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යාමේ මුදල අතර වෙනස ලෙසයි.)

4.5 ක්ෂය

දේපල උපකරණ අයිතම වල එක් එක් කොටස් හි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර ලාභ අලාභ ප්‍රකාශනයේ ක්ෂය වීම් ලෙස දක්වා ඇත.

වත්මන් හා සන්සන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ.

වත්කම් පන්තිය	වාර්ෂික අනුපාතය	කාලය
ගෘහ භාණ්ඩ උපකරණ	5% - 10%	10-20
කාර්යාලයීය උපකරණ	10% - 20%	05-10
මුලාකෘති සැලසුම් සහ නාම පුවරු	6 2/3%	15
මෝටර රථ හා වාහන	20%	05
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	10%	10
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	12.5%	08
කාර්යාලයීය සවිකුරු	10%	10
තාක්ෂණ බීජෞෂණාගාර උපකරණ හා පිරිවිතර	20%	05

2014 ජනවාරි 01 වන දින සිට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 භාවිතා කෙරේ.

4.6 සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල හා උපකරණ

මූල්‍ය තත්වයේ දිනය වන විටත් භාවිතයේ පවතින කොමිෂන් සභාවේ සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල හා උපකරණ වල පිරිවැය පහත පරිදි වේ.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2022 (රු.)	2021 (රු.)
ගෘහ භාණ්ඩ උපකරණ	489,885	861,200
කාර්යාලයීය උපකරණ	3,256,497	5,490,577
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	1,127,435	1,380,935
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	107,850	941,600
එකතුව	4,981,667	8,674,312

4.7 සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලද දේපල උපකරණ

කොමිෂන් සභාවේ පහත සඳහන් දේපල හා උපකරණ වාර්තා කරන දිනට සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලදී.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2022 (රු.)	2021 (රු.)
ගෘහ භාණ්ඩ උපකරණ	19,750	-
කාර්යාලයීය උපකරණ	194,000	19,990
මුලාකෘති සැලසුම් සහ නාම පුවරු	-	110,805
කාර්යාලයීය සවිකුරු	38,000	38,000
එකතුව	251,750	168,795

5. විස්තර කරන ලද දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාල ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසකම් ලබයි.

සේවක අර්ථසාධක අරමුදල කොමිසමෙන් 15% ක් සහ සේවකයන්ගෙන් 10% ක් සේවකයන්ගේ දළ වැටුපෙන් දායක වේ.

සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් කොමිසම සේවක භාර අරමුදලට දායක වේ.

6. අරමුදල්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට රජයේ දායකත්වය, රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අයිතම 02ක් යටතේ සපයනු ලැබේ.

1. පුනරාවර්ථන වියදම් සඳහා අරමුදල්
2. ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල්

කොමිසමේ පුනරාවර්තන වියදම් පහත සඳහන් පරිදි ආදයම් හා වියදම් ගිණුමේ දක්වා ඇත.

1. ආයතන හා පරිපාලන වියදම්
2. පෞද්ගලික වේතන

ප්‍රාග්ධන වියදම් නියෝජනය කරනු ලබන්නේ 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ අරමුණු සපුරාලීම සඳහා කොමිස විසින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වන වියදමයි.

7. මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව වක්‍ර ක්‍රමයට සකස් කර ඇත.

8. අරමුදල් එකතු කිරීම/ අනුග්‍රාහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයකින් ලැබෙන පරිත්‍යාග

කොමිසමේ ප්‍රතිපාද ගිණුම මඟින් පෙන්නුම් කරනුයේ අනුග්‍රහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයන්ගෙන් රැස් කරන ලද අරමුදල් වේ’

		2022 රු.	2021 රු.
1	**මුදල් හා මුදල් සමාන දෑ**		
	මුදල් පොත - 033100101791066	19,799,754	11,925,890
	මුදල් පොත - 033100121791065		
	තාක්ෂණ බීජෝෂණාගාර ස්ථාපිත කිරීම	13,762,138	13,762,138
	IFMSL ව්‍යාපෘතිය	26,687,415	30,495,958
	නව නිපැයුම්කරුවන්ගේ අරමුදල	5,060,562	4,696,812
	මුදල් පොත - 204402131791066 (විදේශ මුදල්)	2,353,101	1,451,059
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**67,662,970**	62,331,856
2	**ණයගැතියෝ**		
	රිෂාන් දුලංජන	316,631	174,223
	C. දසනායක	691,800	668,100
	T.ශක්තිකුමාර්	-	274,000
	S. රණසිංහ	245,698	298,895
	සාගරිකා උපමාලි	128,256	73,012
	උදයසිරි	366,666	366,666
	දිශාන්ත ප්‍රේමනාත්	224,847	97,230
	නිලන්ත ගුණසිංහ	267,930	123,060
	සමන් හෙට්ටිආරච්චි	497,352	204,012
	තුලිත සිහනිදු	580,200	-
	රෝහන් බැසිල් නිශ්ශංක	100,000	-
	ජයවර්ධන	2,800,000	-
	වෙනත් ණයගැතියන් - කාර්යසාධනය නොවන	9,117,683	9,117,683
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**15,337,063**	11,396,880
3	**ඉදිරියට කරන ලද ගෙවීම්**		
	ඉදිරියට කරන ලද ගිවිසුම්ගත සේවාවන්	520,856	525,453
	Laptop පරිගනක මිලදී ගැනීම සඳහා ඉදිරියට කරන ලද ගෙවීම්	-	943,200
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**520,856**	1,468,653
4	**අඩමාණ ණයකරුවන් සඳහා 100% වෙන් කිරීම**		
	ජනවාරි 01 දිනට ශේෂය	9,602,964	9,802,964
	වර්ෂය සඳහා වෙන් කිරීම්	-	-
	බොල් ණය	-	(200,000)
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**9,602,964**	**9,602,964**
5	**නැවත ලැබිය යුතු තැන්පතු**		
	ගැවින්රෝ ප්‍රොපර්ටි ඩිවලොපර්ස්	2,400,000	2,400,000
	මෝබිටෙල් පුද්ගලික සමාගම	2,000	2,000
	එක්ස්ප්‍රස් චෝටර් සිස්ටම් පුද්ගලික සමාගම	5,000	5,000
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**2,407,000**	2,407,000
6	**තොග ඇගයීම (ශ්‍රී. ල. රා. අ. ගි. ප්‍ර. අංක 09)** **වර්ෂය අවසානයේ ඇති ලිපි තොග (FIFO) ක්‍රමය පදනම් කරගනිමින් ශ්‍රී. ල. රා. ගි. ප්‍ර. අංක 09 අනුව ගණන් බලන ලදි**		
	ලිපි ද්‍රව්‍ය		
	ජනවාරි 01 දිනට ශේෂය	386,860	445,954
	වර්ෂය තුළ මිලදී ගැනීම්	549,962	397,200
	වර්ෂය තුළ වියදම්	(341,707)	(456,295)
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**595,115**	386,860
	ටී - ෂර්ට්		
	ජනවාරි 01 දිනට ශේෂය	414,480	414,480
	වර්ෂය තුළ මිලදී ගැනීම්	-	-
	වර්ෂය තුළ වියදම්	(94,200)	
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**320,280**	414,480

ප්‍රකාශනය සඳහා සටහන්.....

7 ක්ෂය - ස්ථාවර වත්කම්

	කාර්යාලයීය උපකරණ	ගෘහ භාණ්ඩ උපකරණ	මූලාකෘති සැලසුම් සහ	වාහන	ප්‍රදර්ශන කුටි	ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ	රූපවාහිනී සහ වීඩියෝ කැසට්	කාර්යාලයීය සවිකුරු	යන්ත්‍ර සූත්‍ර හා සවිකුරු (තාක්ෂණ ඩිජෙෂණාගාර)	එකතුව
	රු.	රු.	රු.	රු.		රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය										**-**
2021 ජනවාරි 01 දිනට ශේෂය	11,057,382	2,412,224	211,305	16,470,191	37,690	2,264,999	950,300	1,139,502	37,477,948	**72,021,543**
වර්ෂය තුළදී එකතුවීම්	757,400	-	-	-	-	-	-	114,355	-	**871,755**
වර්ෂය තුළදී අපහරණයන්	(33,272)	(4,631)	-	-	-	-	-	-	-	**(37,902)**
වත්කම් පන්තින් අතර මාරු කිරීම	(187,992)	161,997	-	-	-	25,995	-	-	-	**-**
බැහැර කිරීම්	(800,261)	-	-	-	(37,690)	-	(3,900)	(1,027,682)	-	**(1,869,533)**
ප්‍රත්‍යාගණනය	-	-	-	5,029,809	-	-	-	-	-	**5,029,809**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,793,257**	**2,569,590**	**211,305**	**21,500,000**		**2,290,994**	**946,400**	**226,175**	**37,477,948**	**76,015,672**
වර්ෂය තුළදී එකතුවීම්	1,336,320	42,098	-	-	-	5,850	-	-	-	**1,384,267**
වර්ෂය තුළදී අපහරණයන්	(27,000)	(944)	(110,805)	-	-	-	-	(18,880)	-	**(157,629)**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**12,102,577**	**2,610,744**	**100,500**	**21,500,000**	**-**	**2,296,844**	**946,400**	**207,295**	**37,477,948**	**77,242,310**
						-			-	
සම්මුචිත ක්ෂය වීම්									-	
2021 ජනවාරි 01 දිනට ශේෂය	9,370,349	1,729,868	171,213	16,470,191	37,690	1,577,965	805,930	557,034	5,822,614	**36,542,851**
වර්ෂය තුළදී එකතුවීම්	1,836,823	256,259	10,050	-	-	182,012	143,497	15,410	7,495,590	**9,939,639**
අපහරණයන්	(32,142)	(4,631)	-	(16,470,191)	-	-	-	-	-	**(16,506,963)**
වත්කම් පන්තින් අතර මාරු කිරීම	(186,145)	160,150	-	-	-	25,995	-	-	-	**0**
බැහැර කිරීම්	(794,692)	-	-	-	(37,690)	-	(3,900)	(473,438)	-	**(1,309,719)**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	10,194,193	2,141,646	181,263	-	-	1,785,972	945,527	99,006	13,318,204	**28,665,809**
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	-	-	-	-	-	10,467	-	**10,467**
ප්‍රයෝජනවත් ජීවිත කාලය ගැලපීම්	(2,792,406)	(731,800)	(23,449)	-	-	(264,595)	(298,708)	(23,804)	-	**(4,134,762)**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)	**7,401,787**	**1,409,846**	**157,813**	**-**	**-**	**1,521,377**	**646,818**	**85,669**	**13,318,204**	**24,541,514**
වර්ෂය තුළදී එකතුවීම්	873,490	149,314	6,700	4,300,000	-	116,417	104,819	16,930	7,495,590	**13,063,260**
අපහරණයන්	(22,133)	(588)	(110,805)	-	-	-	-	(9,668)	-	**(143,194)**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,253,145**	**1,558,572**	**53,708**	**4,300,000**	**-**	**1,637,793**	**751,637**	**92,931**	**20,813,794**	**37,461,580**
ශුද්ධ පොත් අගය									-	
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)	3,391,470	427,944	30,043	21,500,000	-	505,022	873	127,168	24,159,745	**47,349,863**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,849,432**	**1,052,171**	**46,792**	**17,200,000**	**-**	**659,051**	**194,763**	**114,364**	**16,664,155**	**39,780,730**

***** වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය **2022** ජනවාරි **01** සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇත.

*** 2022** දෙසැම්බර් **31** දින සිට වාහන වත්කම් සඳහා ප්‍රති තක්සේරු කිරීමේ ආකෘතිය භාවිත කර ඇත. එම වත්කම් වල සාධාරණ වටිනාකමට ගෙන යනු ලැබේ. නැවත තක්සේරු කිරීමේ අතිරික්තය කොටස් වශයෙන් හඳුනාගෙන ඇත. අනෙකුත් වත්කම් ඉතා ඇවර කරන ලද වත්කම් නොවන නිසා ඓතිහාසික පිරිවැය ආකෘතිය යටතේ වටිනාකම පවතී.

***** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් **253-2750** අංක දරණ වාහනය **2020** සැප්තැම්බර් **17** දින සිට කොමිසමේ භාවිතය සඳහා මාරු කර ඇත.

		2022 රු.	2021 රු.
8 ගෙවිය යුතු වියදම්			
ණයහිමියෝ		2,160,664	1,316,664
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**2,160,664**	1,316,664
9 උපචිත වියදම්			
ගෙවිය යුතු පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක වියදම්		12,558	46,765
ගෙවිය යුතු ජල ගාස්තු		10,562	10,361
ගෙවිය යුතු විදුලිය ගාස්තු		210,295	129,193
ගෙවිය යුතු දුරකථන ගාස්තු		41,592	50,566
ගෙවිය යුතු ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		24,400	200,261
ගෙවිය යුතු විගණන ගාස්තු		1,089,800	770,500
ගෙවිය යුතු අතිකාල දීමනා		9,841	68,816
ගෙවිය යුතු කොන්ත්‍රාත්තුමය සේවා සඳහා ගෙවීම්		171,077	-
සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ගෙවිය යුතු		1,460,355	4,284
ගෙවිය යුතු පරිතෝෂික දීමනා		131,285	-
ගෙවිය යුතු නව නිපැයුම් සමාජ වියදම්		40,000	-
ගෙවිය යුතුවෙනත් දීමනා		-	51,500
ගෙවිය යුතු ගමන් ගාස්තු		350	2,400
ගෙවිය යුතු කුලී වියදම		2,334,000	-
ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම්		-	206,391
ගෙවිය යුතු මුද්දර ගාස්තු වියදම්		1,725	1,950
ගෙවිය යුතු පරිපාලන වියදම්		1,559,191	658,986
වෙනත්ගෙවිය යුතු දෑ		49,500	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**7,146,531**	2,201,973
10 මහවැලි ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන			
ජනවාරි 01 දිනට ශේෂය		6,534,026	-
මහවැලි අධිකාරියෙන් ලද ප්‍රතිපදාන		588,891	22,079,592
ව්‍යාපෘති ක්‍රියාකරකම් සඳහා වූ වියදම්			
නැනෝ විෂන් - අනුරාධපුර ආයතනය වෙත කරන ලද ගෙවීම්		-	(14,159,766)
නිෂ්පාදන භාගය		-	(185,625)
අලිවැට ව්‍යාපෘතිය සඳහා කරන ලද පරිපාලන වියදම්		(564,212)	(366,250)
ණයහිමියෝ - මහාවැලි අධිකාරියට ගෙවිය යුතු		-	(761,525)
ණයහිමියෝ - නැනෝ විෂන්(අනුරාධපුර)ආයතනයට ගෙවිය යුතු		-	(72,400)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**6,558,705**	6,534,026
11 පාරිතෝෂික			
1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ පාරිතෝෂික ගණනය කිරීම් සිදු කර ඇත.			
ජනවාරි 01 දිනට ශේෂය		4,268,344	3,682,614
වර්ෂය සඳහා වෙන් කිරීම්		554,030	585,730
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම්		(398,550)	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**4,423,824**	**4,268,344**
12 IAFM-SL ව්‍යාපෘතිය			
ජනවාරි 01 දිනට ශේෂය		36,472,155	46,472,155
වර්ෂය තුල ප්‍රදාන ලැබීම්		-	-
වර්ෂය තුල සිදුකරන ලද වියදම්		-	(10,000,000)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**36,472,155**	36,472,155
13 තාක්ෂණ බීජෝෂණාගාර ස්ථාපිත කිරීම			
ජනවාරි 01 දිනට ශේෂය		37,921,883	45,417,472
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		-	-
තාක්ෂණ බීජෝෂණාගාර ස්ථාපිත කිරීම් සඳහා වියදම්			
ක්‍රමක් ක්ෂය කිරීම් - රජරට විශ්ව විද්‍යාලය	5	(3,648,242)	(3,648,242)
ක්‍රමක් ක්ෂය කිරීම් - රුහුණු විශ්ව විද්‍යාලය	5	(3,847,348)	(3,847,348)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**30,426,293**	37,921,883
14 ප්‍රාග්ධන ප්‍රදානයන්			
ජනවාරි 01 දිනට ශේෂය		9,905,989	14,334,314
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		10,070,000	7,900,000
ව්‍යාපෘති සඳහා සිදුකරන ලද වියදම්	17	(9,018,748)	(10,107,926)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		(85,500)	(533,750)
ස්ථාවර වත්කම් සඳහා ක්‍රමක් ක්ෂය	5	(5,567,670)	(1,686,650)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**5,304,071**	9,905,989
15 නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල			
ජනවාරි 01 දිනට ශේෂය		12,837,184	13,240,886
"කොවිඩ් 19 වැඩසටහන" යටතේ බෙදාහරින ලද ප්‍රදානයන්		-	(305,120)
නව නිපැයුම් වල තත්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් කාර්මික තාක්ෂණ ආයතනයට ගෙවන ලද වියදම්		-	(93,582)
නව නිපැයුම් වල තත්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් නැනෝ තාක්ෂණ ආයතනය ගෙවන ලද වියදම්		-	(5,000)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**12,837,184**	12,837,184
16 රාජ්‍ය දායකත්වය			
රජයේ දායකත්වය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.			
ශ්‍රී. ලං. ගි. පු. 24ට අනුව			
පුනරාවර්තන ප්‍රදාන		49,400,000	40,370,000
ප්‍රාග්ධන ප්‍රදාන		10,070,000	7,900,000
වර්ෂය සඳහා		**59,470,000**	48,270,000

ප්‍රකාශනය සඳහා සටහන්.....

		2022	2021
		LKR	LKR
17	**වෙනත් ආදායම්**		
	ආපදා ණය - පොළිය	160,948	143,523
	විදේශ මුදල් - පොළිය	42,359	24,984
	සුළු ආදායම්	230,534	13,249
	විදේශ මුදල් ගණුදෙණු වල ලාභය	1,026,742	96,827
	සහසක් නිමැවුම් ලියාපදිංචි ගාස්තු	173,042	501,918
	නිෂ්පාදන භාගය	4,657	230,218
	අලිවැට ව්‍යාපෘතිය සඳහා කරන ලද පරිපාලන වියදම්	-	233,123
		1,638,282	**1,243,844**
18	**පුද්ගලික පඩිනඩි**		
	වැටුප් සහ වේතන	11,375,474	11,671,645
	ජීවන වියදම් දීමනාව	2,188,561	2,301,000
	වෘත්තිය දීමනාව	169,288	144,000
	වෙනත් දීමනා - පුහුණු සේවකයන්	1,402,924	-
	වෙනත් දීමනා	393,000	591,000
	ඉන්ධන වියදම් දීමනාව	550,135	-
	දුරකථන වියදම් දීමනාව	123,000	-
	සේවක අර්ථ සාධක අරමුදල	2,034,605	2,095,897
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	408,699	419,179
	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	629,780	663,301
	කොමිසමේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමිකය ගෙවීම්	1,331,893	1,004,400
	සේවක ඵලදායකත්වය ගොඩනැංවීම	85,500	533,750
		20,692,859	**19,424,172**
19	**ආයතන හා පරිපාලන වියදම්**		
	දේශීය ගමන් වියදම්	143,619	120,464
	ලිපි ද්‍රව්‍ය	353,065	472,407
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	608,233	956,731
	කාර්යාලයීය උපකරණ - අලුත්වැඩියාව සහ නඩත්තුව	9,189	47,100
	වාහන - අලුත් වැඩියාව සහ නඩත්තුව	532,596	2,350,107
	තැපැල් ගාස්තු	56,825	47,900
	සන්නිවේදන ගාස්තු	564,419	736,889
	උපයෝගි වියදම්	20,144	75,491
	කොන්ත්‍රාත්තුමය වියදම්	1,612,152	1,683,038
	විදුලි ගාස්තු	1,250,039	1,213,047
	පිරිසිදු කිරීමේ වියදම්	511,558	469,752
	ජල ගාස්තු	80,969	122,717
	කුලී වියදම්	14,834,000	13,375,000
	සංග්‍රහ වියදම්	244,592	309,020
	විගණන ගාස්තු	319,300	50,000
	මෙහෙයුම් කල්බදු වියදම්	1,591,600	1,790,550
	වෙනත් පරිපාලන වියදම්	2,138,709	1,190,359
		24,871,009	**25,010,573**
20	**නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්**		
	නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන	4,736,746	636,657
	ජනාධිපති සම්මාන ප්‍රධාන උළෙල	74,000	110,111
	සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය	1,952,558	4,924,909
	දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම	28,175	-
	නව නිපැයුම් සමාජ පිහිටුවීම	1,520,000	2,993,863
	SLAAS - FITI - 2020 වැඩසටහන	359,065	731,616
	කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් වැඩසටහන	131,250	413,379
	තාක්ෂණ බීජෝෂණාගාර ස්ථාපිත කිරීම	-	59,545
	නව නිපැයුම්කරුවන් ට ආධාර කිරීමේ ණය යෝජනා ක්‍රමය	-	153,845
	නව නිපැයුම්කරුවන් වාණිජකරණය කිරීම	166,514	12,000
	IAFM-SL ව්‍යාපෘතිය	50,440	72,000
		9,018,748	**10,107,926**
21	**වෙනත් වියදම්**		
	අපහරණ ලාභ (අනෙකුත් උපකරණ)	13,436	560,943
		13,436	**560,943**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IMT/F/SLIC/1/22/04 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 17 දින

කොමසාරිස්,

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කිරීම අවසන් වී ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු. 3,636,467 ක් වූ වත්කම් ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇති වී තිබුණු ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර ප මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 69 ඡේදයෙන් බැහැරව පිරිවැය අගය රු.194,000 ක් වූ භාවිතයෙන් ඉවත්කර තිබූ පරිගණක හා උපාංග සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය සඳහා සලකා බලා නොතිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.19,400 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 07 ඡේදය ප්‍රකාරව මෘදුකාංග අදාල දෘඩාංගයේ අනිවාර්ය අංගයක් නොවන විට, පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු වුවත් රු. 162,964 ක් වටිනා මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) පාසල් වෙත නව නිපැයුම් කව සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලබා දෙන ලද රු. 4,845,000 ක් වූ මූල්‍යාධාර ලැබුණු බවට සනාථ කර ගැනීමට ලැබීම් කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිසමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිසමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිසමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිසම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්

වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොම්සමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිසම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ඈ) ඡේදයෙහි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිසම සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	මුදල් රෙගුලාසි 138 (6) හා (8)	රෙගුලාසිවලින් බැහැර අසම්පූර්ණ වවුචර් සඳහා රු.720,000 ක් සඳහා චෙක්පත් 72 ක් ලියා අදාල දායකයාට භාර දීමෙන් තොරව රඳවාගෙන තිබුණි.
(ආ)	මුදල් රෙගුලාසි 780 (1)	කොමිසමේ නිලධාරීන් විසින් විදුලි වැට බාරදීමේ කටයුතු, YIELD වැඩසටහන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යාම වෙනුවෙන් වායු සමනයකල කාමර සහිත නවාතැන් ගාස්තු, නිලධාරී ආහාරපාන වියදම්, නිලධාරී දීමනා හා ඉන්ධන වියදම් සඳහා එකතුව රු. 1,407,399 ක් වැයකර තිබුණි.
(ඇ)	ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ පළාත් 09 හි පැවති ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් සහභාගී වූ නිළධාරීන් 14ක් වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවීම වෙනුවට නවාතැන් සඳහා රු.461,520 ක් සහ ආහාර පාන සඳහා රු.718,028 ක් වැය කර තිබුණි.
(ඈ)	2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	වසර 05 ඉක්ම වූ භාවිතයෙන් තොරව පවතින රු.568,000 ක් වටිනා වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2009 වර්ෂයට පෙර සිට නව නිපැයුම්කරුවන්ගේ අරමුදලින් ලබා දී තිබූ එකතු වටිනාකම රු. 9,117,682 ක මුදලක් අයවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවශ්‍යතාවය පිළිබඳ අවදානය යොමු කිරීමෙන් තොරව සහසක් නිමැවුම් වැඩසටහන වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. 998,450 ක් වියදම් දරා මුද්‍රණය කරන ලද ටී ෂර්ට් 1270 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් රු. 320,280 ක් වටිනා ටී ෂර්ට් 408 ක තොගයක් ඉතිරි වී තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘති යටතේ ඇති ක්‍රියාකාරකම් වලින් රු.6,950,000 ක් වටිනා උප ක්‍රියාකාරකම් 05 ක් වර්ෂය තුළ ක්‍රියාත්මකකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී YIELD හා පළාත් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වැය කර ඇති මුළු පිරිවැය රු. 3,254,791 කි. ඉන් වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිසට ආහාරපාන ලබා දීමට, සහභාගී වූ කොමිසමේ නිලධාරීන්ට ආහාරපාන හා නවාතැන් පහසුකම් ලබාදීමට, වැනි අරමුණට සෘජුව බලනොපාන කාර්යයන් සඳහා මුළු වියදමින් සියයට 81 ක් වැය කර තිබුණි.

(ඉ) 2021 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු.843,924 ක් වූ නිරවුල් නොවූ ණය හිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ නව නිපැයුම් සමාජ පිහිටුවීම සඳහා අයදුම්පත් ලැබී නොතිබුණු පාසල් 176 ක් සඳහා රු.1,780,000 ක් ලබාදී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2022 විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම
1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කිරීම අවසන් වී ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.3,636,467 ක් වූ වත්කම් ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇති වී තිබුණු ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.	පාලක මණ්ඩල තීරණ අංක 1035.04.02 අනුව 2022 ජනවාරි 01 දින සිට වත්කම් වල ජීව කාලය සංශෝධනය කර ඇත. එය සමාලෝචිත වර්ෂයේ ගිණුම් වල ගැලපීම් කර ඇත. මෙහී ඵලදායී ජීවිත කාලය සංශෝධනයේ දී, වත්කම් පන්ති වල සාමාන්‍ය ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන ඇත. ප්‍රායෝගිකව ගණනය කිරීම් සිදු කිරීමේ දී වත්කම් පන්තිය තුල, සම්පූර්ණ ක්ෂය වූ වත්කම් ද පැවතීය හැක. එම වත්කම් ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර ඇත.
2. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 07 ඡේදය ප්‍රකාරව මෘදුකාංග අදාල දෘඩාංගයේ අනිවාර්ය අංගයක් නොවන විට, පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු වුවත් රු. 162,964 ක් වටිනා මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2023 වර්ෂයට අදාල ගිණුම් සකස් කිරීමේ දී අස්පෘශ්‍ය වත්කම් වෙනම මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
3. වත්කමක් සම්පූර්ණයෙන් ක්ෂය කර නැත්නම් වත්කම අක්‍රීයව පැවතියද ක්ෂය කිරීම නවත්වනු නොලැබිය යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය අවසන් නොවූ රු.194,000 ක් වූ භාවිතයෙන් ඉවත්කර තිබූ පරිගණක හා උපාංග සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය සඳහා සලකා බලා නොතිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.19,400 ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිරීක්ෂණ පිළිගනිමි. 2023 වර්ෂයේ ආරම්භක ශේෂයන් නැවත සකස් කර ඉදිරිපත් කරනු ඇත.
4. පාසල් වෙත නව නිපැයුම් කව සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මූල්‍යාධාර ලබාදීම.	මූල්‍යාධාර පාසල වෙත ලැබුණු බව සනාථ කිරීම සඳහා විධිමත් කුවිතාන්සියක් පාසල විසින් කොමිසම වෙත ලැබී නොතිබුණු බවට ඔබ කල නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී එය නිවැරදි කරගැනීමට කටයුතු කරනු ඇත.

5. 2009 වර්ෂයට පෙර සිට නව නිපැයුම්කරුවන්ගේ අරමුදලින් ලබා දී තිබූ එකතු වටිනාකම රු.9,117,682 ක මුදලක් අයවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි.
6. ඉකුත් වසරේ සිට පැවත එන එකතුව රු.843,924 ක් වූ නිරවුල් නොවූ ණය හිමි ශේෂය නිරවුල් කිරීමට කොමිසම විසින් කටයුතු කර නොතිබුණි.	මහවැලි අධිකාරිය සමඟ තිබූ රැස්වීම් වල සාකච්ඡා අනුව රු.761,524 ක් වූ මුදල තෝඩා ගොවිපලේ වැඩ සඳහා යොදා ගන්නා ලෙස නියම කර ඇත. පාලක මණ්ඩල තීරණ අනුව රු.72,400 ක මුදල මහවැලි අධිකාරියට ගෙවීමෙන් පසු නැනෝ විෂන් ආයතනය වෙත ගෙවීම් සිදු කල යුතු බව තීරණය වී ඇත. ඒ අනුව මහවැලි අධිකාරියට මෙම ගෙවීම සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග විමසා ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ගයක් ඉදිරියේ දී ගනු ඇත. රු. 10,000 ක් වටිනා අංක 539398 දරන චෙක්පත ඉතා ඉක්මණින් නිරවුල් කිරීමට කටයුතු කරමි.
7. වවුවරය සහතික කිරීමට පෙර බලයලත් අධිකාරී විසින් , දෙනු ලැබ ඇති සහතික යනාදිය අරමුණු ලබන බව හෝ එකී සහතික යනාදිය අඩංගු ලිපිගොනු පිළිබඳ ගොනු සඳහන් සටහන එම වවුවරයේ යොදා ඇති බවත් , වවුවරය නිවැරදි හා සෑම විස්තරයක් අතින්ම සම්පූර්ණ බවත් සහතික කළ යුතු වුවත් කොමිසම විසින් සම්පූර්ණ විස්තර සනාථ කර ගැනීමකින් තොරව රු.720,000 ක් වටිනා චෙක්පත් 72 ක් ලියා දායකයාට භාර දීමෙන් තොරව රදවාගෙන තිබුණි.	පාසල් තුල නව නිර්මාණ කරනය සඳහා අවශ්‍ය උකරණ මිලදී ගැනීමට හා පාසල තුල නව නිපැයුම් ප්‍රවර්ධනයට රු.10,000 බැගින් වටිනා චෙක්පත් ලබා දුන් අතර එහිදී පාසල් නවනිපැයුම් සමාජ පිහිටවා විස්තර සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය කොමිසම වෙත ලබාදීමට අපොහොසත්වූ පාසල් 72 කට අදාලව චෙක්පත් අදාල පාසල් සංවර්ධන ගිණුමට බැරකිරීමට නොහැකිව තිබුනි. එම පාසල් වෙත අදාල අයදුම් පත්‍රය සම්පූර්ණ කර එවීමට සිහි කැඳවුම් ලිපියක් ද යවා ඇති අතර එසේ නොඑවන පාසල් වල චෙක්පත් ඉදිරියේදී අවලංගු කිරීමට කොමිසම කටයුතු කරනු ඇත.
8. බිල්පතේ වටිනාකම නිවැරදි බවට තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබූ අවස්ථා 10 ක් නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර වටිනාකම රු.748,070 කි.	2022/85 - ඉදිරියේදී බිල්පත් වල ඒකක ප්‍රමාණය සහ වටිනාකම සඳහන් විධිමත් බිල්පත් ලබා ගැනීමට කටයුතු කරමි 2022/87,2022/89, 2022/222, 2022/223, 2022/267, 2022/597, 2022/772 - මෙම වවුවර් සඳහා ඇති නිරීක්ෂණය පිළිගනිමි. මේ සම්බන්ධ ආයතනයේ නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. 2022/998 - මෙම පිළිතුර සමඟ සහභාගීවීමේ සහතිකපත් අමුණා ඇති බව දන්වා සිටිමි.

9. ආදායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගන්නා බවට වවුචරය සඳහා මුදල් ගෙවන නිළධාරියා ගණන්දීමේ නිළධාරියාට වගකිව යුතු වුවත් එලෙස අනන්‍යතාව තහවුරු කර ගැනීමකින් තොරව 2023 මාර්තු විගණන දිනය වන විටත් නව නිපැයුම් සමාජ පිහිටුවීම සඳහා අයදුම්පත් ලැබී නොතිබුණු පාසල් 176 ක් සඳහා රු.1,780,000 ක් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ලබාදී තිබුණි.	අයදුම්පත් යොමු කර නොතිබූ පාසල් 176ක් සඳහා මූල්‍යාධාර ලබාදී තිබීම පිළිබඳව ඔබගේ නිරීක්ෂණය අනුව, •පාසල් 70 ක් සඳහා නැවත සිහි කැඳවීම් කලත් ඒ සඳහා ප්‍රතිචාර නොදැක්වීම තුල එම පාසල් නව නිපැයුම් සමාජ පිහිටුවීමට අදාලව වෙක්පත් ඉදිරියේදී අවලංගු කිරීමට කටයුතු කරනු ඇත. •පාසල් 10 ක වෙක්පත් සඳහා නව නිපැයුම් සමාජ අයදුම්පත් හෝ එහි පිටපත් දැනට ලැබී තිබේ. •පාසල් 96 අයදුම්පත් කොරෝනා වසංගතය හේතුවෙන් විටින් විට වසා දැමීමෙන්, උද්ගතවුනු ආර්ථික අර්බුදය, ඉන්ධන නොමැතිවීම, පාසල් තුල වූ ගුරු හා විදුහල්පති වැඩවර්ජන මෙන්ම මගහැරුනු අධ්‍යාපන කටයුතුවලට මුල්තැන දෙමින් කටයුතු කිරීම හේතුවෙන් අයදුම්පත් ප්‍රමාද වී ඇත. එවැනි තත්වයන් සිදු නොවීමට කොමිසම ඉදිරියේදී කටයුතු කරනු ඇත.
10. තත්කාර්ය අතුරු අග්‍රිමයන් දීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිළධාරීන්ට පමණක් සීමා වියයුතුය යන්න විධිවිධාන පනවා තිබුනද කොමිසමේ මාණ්ඩලික තත්වයේ නොවන නිලධාරීන්ට ද අතුරු අග්‍රිම ලබා දී තිබුණි.	කොමිසමේ අත්තිකාරම් මුදල් ලබාගත හැකි මාණ්ඩලික නිලධාරීන් ප්‍රමාණය 06 කි. ප්‍රධාන ව්‍යාපෘති අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන අනු ව්‍යාපෘති සහ විවිධ ආයතන වල ඉල්ලීම් පරිදි සිදුකරන වැඩසටහන් වලදී එම මාණ්ඩලික නිලධාරීන්ගෙන් පමණක් අත්තිකාරම් මුදල් කළමනාකරණය කිරීම ඉතා අපහසු වේ. එබැවින් මු.රෙ. 135 මූල්‍ය බලය පවරා දීමේ ලේඛනය තුල අනෙකුත් නිලධාරීන්ට ද මූල්‍ය සීමාවකට යටත්ව අත්තිකාරම් මුදල් නිකුත් කිරීමට පාලක මණ්ඩලයට යොමුකර අනුමැතිය ලබාගෙන ඇත.
11. අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතුය යන්න විධිවිධාන පනවා තිබුනද අවස්ථා 07 කදී එකතුව රු.462,000 ක් වූ අත්තිකාරම් පියවීමේදී දින 06 සිට දින 19 දක්වා කාලයක් ප්‍රමාද වුවද ඒ සඳහා කොමිසම අවධානය යොමුකර නොතිබුණි.	ඔබගේ නිර්දේශය පරිදි ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.
12. ලියනු ලබන සෑම වෙක්පතකම උප පත්‍රිකාවෙහි වවුචර අංකය සඳහන් කල යුතු බවට විධිවිධාන පනවා තිබුණද ඒ සඳහා කොමිසමේ අවධානය යොමු වී නොතිබුණි.	නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි වැරදි සිදුනොවීමට කටයුතු කරනු ඇත.

13. හරි වැරදි බලන දිනට බඩුලේඛන පොතෙහි දැක්වෙන භාණ්ඩ ශේෂය සමඟ සසඳා සෑම භාණ්ඩයක්ම නිවැරදි දැයි භෞතිකව පරීක්ෂා කළ යුතු වුවත් එලෙස බඩුලේඛන පොතේ ශේෂය සමඟ සැසඳූ බව සහතික කිරීම සඳහා එම පොත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කල බවට සටහන් කර අත්සන් තබා නොතිබුණි.	මේ සම්බන්ධ පවතින නොදැනුවත්භාවය නිසා එම වැරදීම සිදු වී ඇති අතර ඉදිරි වර්ෂයේදී සිදු කරන භාණ්ඩ සමීක්ෂණයේ දී ඔබ විසින් පෙන්වා දුන් නිරීක්ෂණය අනුව කටයුතු කරන බව දන්වා සිටිමි.
14. රජයේ වැඩ හා සේවාවන් ඉටු කිරීමේදී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඒවා ඉටු කිරීමේ අවශ්‍යතාවය ගැන සෑම ආයතනයක්ම නිසි පරිදි සැලකිලිමත් විය යුතුය යන්න විධිවිධාන පනවා තිබුණද, විදුලි වැට බාරදීමේ කටයුතු, YIELD හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යාම වෙනුවෙන් වායු සමනය කල කාමර සඳහා නවාතැන් ගාස්තු, ආහාරපාන වියදම්, ඉන්ධන වියදම් හා දීමනා සඳහා එකතුව රු.1,407,399 ක් කොමිසමේ නිලධාරීන් වෙනුවෙන් වැයකර තිබුණි. කොමිසමේ නිළධාරීන් වෙනුවෙන් දැරූ මුළු වියදම නව නිපැයුම් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වලින් සියයට 31ක් විය.	කොමිසම විසින් නිළධාරීන් සඳහා අවශ්‍ය නවාතැන් පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් හැකි සෑම අවස්ථාවකදීම රාජ්‍ය ආයතන මඟින් එම පහසුකම් ලබා ගැනීමට කටයුතු කර තිබුනි. එමෙන්ම රට තුල පැවැති අධික උද්ධමන ආර්ථික තත්වය හේතුවෙන් භාණ්ඩ හා සේවාවන් හි මිළ ද අධික ලෙස ඉහල ගොස් ඇති වාතාවරණයක මෙම කටයුතු කරගෙන යාමට සිදුවීම නිසා සාපේක්ෂව වැඩි වියදමක් දරන්නට සිදුවූ බව ඔබගේ අවධානයට යොමු කරමි.
15. දිවයින ඇතුළත රාජකාරී ගමන් ආරම්භ කරන ස්ථානය නිලධාරියා වැඩ කරන ස්ථානය වන අතර 2.2 ඡේදය ප්‍රකාරව ගමන පිටත්වන්නේ තම නිවසින් නම්, තම නිවස ගමන ආරම්භ කරන ස්ථානය ලෙස සැලකිය හැක්කේ, නිවස ඔහු වැඩකරන නාගරික බල මණ්ඩල ප්‍රදේශය ඇතුළතම පිහිටා තිබෙන්නේ නම් හෝ ඔහුගේ නිවස ඔහු වැඩ කරන ස්ථානයේ සිට සැතපුම් 04 ක් ඇතුළත පිහිටා තිබෙන්නේ නම් හෝ ඔහු වැඩ කරන ස්ථානයට වඩා ඔහුගේ නිවස ගමනාන්තයට කිට්ටු වන්නේ නම් පමණි යන්න විධිවිධාන පනවා තිබුණද විදුලි වැට නිරීක්ෂණ කටයුතු සඳහා පොලොන්නරුවට යාම වෙනුවෙන් 193Km ධාවනය කර නිලධාරීන් නිවෙස් වලින් රැගෙන ගමන ආරම්භ කර තිබුණි.	ඔබගේ නිරීක්ෂණය පිලිගනිමි. එය ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සලසනු ඇත.
16. රාජකාරී ගමන් බිමන් යා යුත්තේ ඒ ඒ අවස්ථාවේදී පවතින තත්වය අනුව හැකි තරම් ඉක්මනින් යා හැකි ඉතාම කෙටි මාර්ගයෙන් හා ආණ්ඩුවට අඩුම වියදම දැරීමට සිදුවන පරිදිය යන්න විධි විධාන පනවා තිබුණද කොමිසම ඒ සඳහා අවධානය යොමු නොකර සමාලෝචිත වර්ෂයේදී නුවරඑළිය, නැගෙනහිර පළාත හා ඌව පළාත යන ස්ථානයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් වලට විදුලි වැට භාරදීම හා නිරීක්ෂණ කටයුතු වලට යාමේදී නියමිත දුර ප්‍රමාණය ඉක්මවා රථය ධාවනය කර තිබූ කිලෝ මීටර ගණන 842 Km ක් වූ අතර ඒ සඳහා දරා තිබූ අතිරේක පිරිවැය රු. 22,501 ක් විය.	ඔබගේ නිරීක්ෂණය පිලිගනිමි. එය ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සලසනු ඇත

17. රජයේ ආයතන වල අපහරණය කළ යුතු භාණ්ඩ හා වත්කම් හඳුනාගෙන ඇත්නම් එම භාණ්ඩ නියමිත පරිදි වහාම අපහරණය කළ යුතු යැයි විධිවිධාන පනවා තිබුණ නමුත් වසර 05 ඉක්ම වූ භාවිතයෙන් තොරව පවතින රු.568,000 ක් වටිනා වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ කමිටුවේ නිර්දේශයන් මත අදාල ඉවත් කිරීම් සිදු කර ඇත.
18. අවශ්‍යතාවය පිළිබඳ අවදානය යොමු කිරීමෙන් තොරව සහසක් නිමැවුම් වැඩසටහන වෙනුවෙන් වර්ෂ 4 කට පෙර එනම් 2018 වර්ෂයේදී රු.998,450 ක් වියදම් දරා මුද්‍රණය කරන ලද ටී ෂර්ට් 1270 ක තොගයකින් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් රු.320,280 ක් වටිනා ටී ෂර්ට් 408 ක තොගයක් ඉතිරි වී තිබුණි.	නිරීක්ෂණ නිවැරදි බව පිළිගන්නා අතර ඉදිරියේදී එම කරුණු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. ව්‍යාපෘති අංශයේ විවිධ වැඩසටහන් වල දී එම ටී ෂර්ට් තොගය ක්‍රමවත්ව බෙදාහැරීමට කටයුතු කරමින් පවතී.
19. සමාලෝචිත වර්ෂයේදී YIELD හා පළාත් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වැය කර ඇති මුළු පිරිවැය 3,254,791 කි.ඉන් සියයට 45ක් එනම් රු1,475,460. ක් වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිසට ආහාරපාන ලබා දීමටත් , 22% ක් එනම් රු. 728,408 ක් වැඩසටහන් සඳහා සහභාගී වූ කොමිසමේ නිලධාරීන්ට ආහාරපාන ලබාදීමටත් , 14% එනම් රු. 451,138ක් වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන්ට නවාතැන් පහසුකම් ලබා දීමටත් ප්‍රාග්ධන අරමුදල් වියදම් කර තිබූ අතර ඒ අනුව මුළු වියදමින් සියයට 81 ප්‍රමාණයක් අරමුණුගත කාර්යයන් සඳහා නොව ආහාරපාන හා නවාතැන් සඳහා වියදම් කර තිබුණි .	YIELD 3D Innovation Competition හි පුහුණු වැඩසටහන් සඳහා කොමිසම අදාල සංවිධාන කටයුතු සිදුකරන ලද අතර ඒ වෙනුවෙන් සම්පත් දායකත්වයන් Panacea Solutions ආයතනය මගින් නොමිලේ සපයාගැනීමට කොමිසමට හැකිවිය. ඒ වෙනුවෙන් වූ ආහාරපාන ලබාදීම්, නවාතැන් පහසුකම් සැපයීම් අදාල ව්‍යාපෘතියේම කොටස් ලෙස සළකා ව්‍යාපෘතීන් සැලසුම් කරන ලද අතර එම වැඩසටහන් මාලාව සාර්ථකව කරගෙන යාම සඳහා එම කාර්යයන් අත්‍යාවශ්‍ය විය. ඒ අනුව එම ව්‍යාපෘතීන් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී එම වියදම් කාණ්ඩයන් ද ඇතුලත්ව එම ඇස්තමේන්තු සකස් කරනු ලැබූ බැවින් ව්‍යාපෘතියෙහි අරමුණුගත කාර්යයන් වෙනුවෙන් අදාල වියදම් දරා ඇත. නිළධාරීන් සඳහා අවශ්‍ය නවාතැන් පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් හැකි සෑම අවස්ථාවකදීම රාජ්‍ය ආයතන මඟින් එම පහසුකම් ලබා ගැනීමට කටයුතු කර තිබුණි.
20. කළමනාකරණ මණ්ඩල තීරණ අංක 1002.01.07 ප්‍රකාරව අළුතින් ලියාපදිංචි කරන ලද නව නිපැයුම් කව සඳහා මූල්‍යාධාර ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණු නමුත් 2019 වසරේ සිට ලැබී තිබුණු අයදුම්පත් 595 ක ප්‍රමාණ නිසිලෙස අධ්‍යයනය කර එම පාසල් ලියාපදිංචි කර පාසලේ නම, ලිපිනය ගිණුම් අංකය, විදුහල්පති, සම්බන්ධීකාරකගේ දුරකථන අංකය ආදී නිවැරදි තොරතුරු ඇතුලත් කර සකසන ලද ලේඛනගත හෝ පරිගණක ගත දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි.	ගිණුම් අංක හා යාවත්කාලීන කරන ලද වැඩි විස්තර ඉදිරියේ දී එම දත්ත ගොනුවට ඇතළත් කිරීමට නියමිතය.

21. නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අංක Slic/ AC / FM -: 2022 හා 2022 නොවැම්බර් 10 දිනැති අධ්‍යක්ෂවරයාගේ ‘‘චෙක්පත් මුදල් කර ගැනීම සම්බනධවයි’’ යන්න මහජන බැංකු කළමණාකරු ඇමතූ ලිපියට අනුව ආයතනයේ දෛනික ගනුදෙනු උදෙසා චෙක්පත් මුදල් කර ගැනීම සඳහා අත්සන් බැංකුවෙත ලබා දී තිබුණි. මෙම නිළධාරීන් අතර රියදුරු මහතුන් හා කාර්යාල කාර්ය සහයක මහතුන්ද ඇතුලත් වූ බැවින් මෙය මූල්‍ය පාලනයේ දුර්වල තත්වයක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.	ආයතනයේ අනුමත කාර්යය මණ්ඩල සංඛ්‍යාව තුල සරළ තනතුර නොමැත. එම නිසා චෙක්පත් මුදල් කර ගැනීමට ඔබ විසින් පෙන්වා දුන් පරිදි කළමණාකරන සහකාර තනතුර දරන නිළධාරීන් පමණක් පත් කිරීමට කටයුතු කර ඇත.
22. පළාත් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා 2022 වර්ෂයේදී දරා ඇති මුළු වියදම රු. 1,668,000 කි. එම දැනුවත් කිරීම් සඳහා පාදක වූ 2022 සහසක් නිමැවුම් ජාතික තරඟය සඳහා ලියාපදිංචි කර ඇති නවෝත්පාදන සංඛ්‍යාව 402 කි. එම පළාත තුල දින 02 ක් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබූ අතර ඒ සඳහා වියදම් කර ඇති මුදල රු.209,419 කි. දකුණ හා බස්නාහිර පළාත්වල 2022 සහසක් නිමැවුම් තරඟය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණද පිළිවෙලින් 84 හා 93 බැගින් නවෝත්පාදන ලියාපදිංචි වී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව පැහැදිළි වන්නේ දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් නවෝත්පාදනයන් කෙරෙහි අභිප්‍රේරණයක් ඇති කිරීමට සෘජු බලපෑමක් නොවන බවයි.	කොමිසම නිරන්තරයෙන් තම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නව ආරක වැඩසටහන් හැකි සෑමවිටම ක්‍රියාත්මක කිරීමට උත්සහ කරන අතරම එහි ප්‍රතිඵලයක් ලෙස දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වෙනත් වර්ෂයන්ට වඩා වැඩි පිරිසක් ආකර්ෂණය කර ගැනීමට 2022 වසරේ පැවැත්වූ වැඩසටහන් සඳහා හැකියාව ලැබුණි. එනමුත් රට තුල උද්ගතවූ අර්බුධකාරී වාතාවරණය හමුවේ 2022 වර්ෂයේදී ආරම්භකළ වැඩසටහන් මාලාව නිසිපරිදි අවසන් කිරීමට ඉඩ ප්‍රස්ථාව නොලැබීමත්, මූල්‍ය පහසුකම් නොලැබීමත් මත ව්‍යාපෘතීන් අඛන්ඩව සිදුකරගෙන යාමට නොහැකිවීමත්, අඩාලව පැවැති දෛනික කටයුතු නැවත යථා තත්වයට පත්කර ගැනීමට වැඩි අවධානයක් ලබාදීමත් යන කාරණා මත 2022 වර්ෂයේදී අපේක්ෂිත නව නිර්මාණ ප්‍රමාණය රට තුළින් මතුකර ගැනීමට නොහැකි විය. දැනුවත්කිරීමේ වැඩසටහන් මඟින් නවෝත්පාදනයන් කෙරෙහි අභිප්‍රේරණයක් ඇතිකිරීමට සෘජු බලපෑමක් නොවන බවට වූ ඔබගේ පැහැදිලි කිරීම සමඟ එකඟ නොවෙමි. තවද වඩාත් කාර්යක්ෂම ලෙස නවෝත්පාදකයින් උනන්දු කරලීම හා දැනුවත්කිරීම සඳහා නව ක්‍රමවේදයන් අනුගමනය කරමින් වැඩි ආකර්ෂණයක් සහිත නව වැඩසටහන් දියත් කිරීමට කොමිසම අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වා සිටිමි.
23. පාසල් තුළ නව නිපැයුම් සමාජයක් පිහිටුවා තිබේද, එය ක්‍රියාකාරී තත්වයේ පවතීද යන්න නිසිලෙස අධීක්ෂණය කිරීමක් කොමිසම විසින් සිදු නොකරන බව නිරීක්ෂණය විය.	2022 වර්ෂයේ අදාල අධීක්ෂණ කටයුතු වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය පහසුකම් කොමිසම වෙත නොලැබීම හේතුවෙන් නිසි ලෙස එම නව නිපැයුම් සමාජ අධීක්ෂණය කිරීමට නොහැකිවිය. ඉදිරියේදී නව නිපැයුම් සමාජ සක්‍රීයව පවත්වා ගැනීම සඳහා පහත ක්‍රියාකාරකම් සිදුකිරීමට බලාපොරොත්තු වෙමු.
24. වර්ෂය සඳහා ලිපිද්‍රව්‍ය වල අවශ්‍යතාව ඇස්තමේන්තු සකස් කර මනාව අධ්‍යයනය කර තොග ඇනවුම් නොකිරීම හේතුවෙන් වාර්ෂික තොග අවශ්‍යතාව ඉක්මවා රු.595,115 ක අතිරික්ත තොග පැවතුනි.	ව්‍යාපෘති අංශය විසින් වසර තුල දී සැලසුම් කරන ලද ව්‍යාපෘති එම වසරේ අපේක්ෂිත මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ලිපිද්‍රව්‍ය අධි අතිරික්තයක් පවතී.
25. 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නව නිපැයුම් කව පිහිටුවීම හා ඒවා අධීක්ෂණය කිරීම සඳහා	2022 වර්ෂයේ පාසල් නව නිපැයුම් සමාජ 132 පිහිටුවා ඇති අතර විශ්ව විද්‍යාල නව නිපැයුම් සමාජ 5ක් පිහිටුවා ඇත.

කොමිසම විසින් රු.1,800,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඒ තුළින් 2022 වර්ෂයේ කොමිසමේ අරමුණ වී තිබුණේ පාසල් කව 50 ක් , විශ්වවිද්‍යාල කව 20 ක් අළුතින් පිහිටුවීම හා ජාතික මට්ටමේ තරඟ සඳහා නව නිමැයුම් 80 ක් ඉදිරිපත් කිරීමයි. එසේ වූවද 2022 වර්ෂයේ සහසක් නිමැවුම් ජාතික තරඟය විගණන දිනය වන විටත් පවත්වා නොතිබුණු අතර 2019 සිට 2023 දක්වා වසර 04 ක කාලච්ඡේදය තුළ විශ්වවිද්‍යාල තුළ පිහිටුවා ඇති මුළු කව ප්‍රමාණය 06 කි. ඒ අනුව කොමිසමේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට නොහැකි වී තිබුණු අතර අපේක්ෂිත ප්‍රතිලාභය වූ තරුණ ප්‍රජාව අතර නව නිපැයුම් සංස්කෘතියක් ඇති කිරීම හා රටතුළ ආයෝජන අවස්ථා ලබාදීම යන ප්‍රතිලාභ ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.	2020 මාර්තු මස සිට රට කොරෝනා වසංගතය හේතුවෙන් විටින් විට වසා දැමීමත්, පාසල් පද්ධතිය තුල විටින් විට ඇති වූ අර්බුධකාරී වාතාවරණය හා රටේ උද්ගතවුනු ආර්ථික අර්බුදය,ඉන්ධන නොමැතිවීම, මගහැරුනු අධ්‍යාපන කටයුතුවලට මුල්තැන දෙමින් කටයුතු කිරීම යනාදිය හේතුවෙන් අපේක්ෂිත ආකාරයට විශ්ව විද්‍යාල තුල නව නිපැයුම්කරණයට උනන්දුවක් ඇති කරමින් අවශ්‍ය සහයෝගය ඔවුන් වෙතින් ලබාගැනීමට අපහසු විය. මෙම ගැටළු නිරාකරනය වෙමින් පවතින තත්වය අනුව ඉදිරියේදී කොමිසම වෙතින් නව නිපැයුම් සමාජ වඩාත් ක්‍රමවත්ව විශ්ව විද්‍යාල පද්ධතිය තුල බිහි කිරීමට කටයුතු කරනු ඇත. එමෙන්ම එමඟින් වඩාත් සඵලදායී නව නිර්මාණ සමාජගත කිරීමට මෙන්ම කොමිසම වෙතින් ක්‍රියාත්මක කරනු ලබන නවමු ව්‍යාපෘති යටතේ සුදුසු වාණිජකරන අවස්ථා සඳහා ඒවා යොමු කිරීමට ද කොමිසම කටයුතු කරනු ඇත.
26. 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙහි ශේෂය රු.12,837,184 ක් වූ අතර මෙම ගිණුම 2022 වර්ෂය තුලදී නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.	නව නිපැයුම්කරුවන් සඳහා ණය ආධාර ලබා දීම විධිමත් කිරීමේ අරමුණින් ඔවුන් බැංකු පද්ධතිය වෙත යොමු කර ඇති අතර, අප විසින් RDB බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති බව ද කාරුණිකව දන්වා සිටිමි. තව ද නව නිපැයුම්කරුවන් 07 දෙනෙකුගේ ක්ෂේත්‍ර පරීක්ෂණයන් කොමිසම හා RDB බැංකුව එක්ව සිදු කර ඇත.
27. ක්‍රියාකාරී සැලැස්ම අනුව පේටන්ට් බලපත්‍ර 40 ක් සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දීමට අපේක්ෂා කර තිබුණද වර්ෂය තුල නව නිපැයුම්කරුවන් 04 දෙනෙකු පමණක් කොමිසම වෙත යොමුවී තිබුණි.	පේටන්ට් අයදුම් කිරීම හා අවශ්‍ය සහයන් ලබාදීම වෙනුවෙන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක 09 ක වැඩසටහන් 09 ක් ද, දැනුවත්කිරීමේ සම්මන්ත්‍රණ හා වැඩමුළු 04 ක් පාසල් 03 කදී හා එක් විශ්ව විද්‍යාලයකදී ද , මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විශ්වවිද්‍යාල 02 ක් සඳහා ද සිදුකර ඇත. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් 8ක් සඳහා පේටන්ට් වැඩමුළු 02 ක් සිදුකර ඇත. නව නිර්මාණ 09ක් සඳහා පේටන්ට් අයදුම්පත් ගාස්තුව ප්‍රතිපූරණය කර ඇත.
28. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය තුළ එක් එක් උප ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ගේ මූල්‍ය හා භෞතික ප්‍රගතියත්, එම ප්‍රගතීන්හි ප්‍රතිශතත් ඒ ඒ උප ක්‍රියාකාරකම ඉදිරියෙන් වෙන් වෙන්ව පැහැදිලිව දැක්විය යුතු වුවත් එලෙස දක්වා නොතිබුණි.	2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් උප ක්‍රියාකාරකම් වෙන් වෙන්ව දැක්වීම සම්බන්ධයෙන් වූ ඔබගේ නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැසුම් ඔබගේ නිරීක්ෂණයට අනුකූලව සැකසීමට කටයුතු කරමි.
29. ක්‍රියාකාරී සැලැස්මේ YIELD වැඩසටහන හා දැනුවත් කිරීමේ වැඩසටහන යන උප ක්‍රියාකාරකම් සඳහා අනුමත කරන ලද ඇස්තමේන්තු මුදල පිළිවෙළින් රු.200,000 ක් හා 700,000 ක් වුවත් ඒ සඳහා දැරූ වියදම පිළිවෙලින් රු.1,367,222 ක් හා රු.2,518,093 ක් විය. එම සීමාව ඉක්මවා පිළිවෙළින් රු. 1,167,222 ක් හා රු.1,818,093 ක් වියදම් දරා තිබුණි. එම ඉක්මවීම ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 584% ක් හා 260% ක් විය.	ඔබ විසින් පෙන්වා දී ඇති උප ක්‍රියාකාරකම්වලට අදාලව අනුමැතිය ඉක්මවා දැරූ වියදම් සම්බන්ධයෙන් වූ නිරීක්ෂණය පිළිගනිමි.

30. ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘති යටතේ ඇති ක්‍රියාකාරකම් වලින් රු.6,950,000 ක් වටිනා උප ක්‍රියාකාරකම් 05 ක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි.	අදාල කටයුතු සිදුකර ගෙන යාමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් ද නිසි පරිදි කොමිසම වෙත නොලැබුණු අතර ඒ හේතුවෙන් අඛන්ඩව මාස ගණනාවක් පුරා ක්‍රියාත්මක වන මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් අතරමග නවතා තැබීමට ද සිදු විය. ඒ අනුව ‘‘සහසක් නිමැවුම්’’ - 2022 තරඟය අදාල වර්ෂය තුල සම්පූර්ණ කිරීමට නොහැකි වූ බවට ඔබ කල නිරීක්ෂණය පිලිගනිමි.
31. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති රු.19,950,000 ක් වටිනා උප ක්‍රියාකාරකම් 08 ක් අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟා වී නොතිබුණි.	අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟා වී නොතිබුණු ක්‍රියාකාරකම් පිළිබඳව ඔබගේ නිරීක්ෂණයන් පිළිගනිමි.
32. Innovation To Village වැඩ සටහන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.2, 250, 000 ක ප්‍රතිපාදන වෙන් කර ඇතත් වර්ෂය තුළදී රු.148, 623 ක් වැයකර එක් වැඩසටහනක් පමණක් සිදුකර තිබුණි.	මෙම වැඩසටහන අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද වැඩසටහනක් වන අතර ඉන් එක් වැඩසටහනක් පමණක් සිදු කරන ලදි.